# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,718 — 1959 අප්‍රේල් 3 වැනි සිකුරාද—3.4.1959**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)**


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

**(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)**


| | පිට | | පිට |
|---|---|---|---|
| **තනතුරු-ඇබෑර්තු** ... ... | 847 | **තොටුපළ් ඓත්ද හා වෙනත් ඓත්ද විකිණීම** | — |
| **විභාග, විභාග ප්‍රතිඵල ආදිය** ... | 852 | **ආණ්ඩුවේ නොවන දැන්වීම් ...** ... | — |
| **ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්** ... | 853 | **රට සීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත්** | — |
| **තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්** | — | **වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම්** ... | — |
| **බඩු භාණ්ඩාදිය විකිණීම** ... ... | 864 | **විවිධ දැන්වීම්** ... ... | — |


# තනතුරු—ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී, ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායයි සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් සවකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්‍ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්‍ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්‍ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් සවකීය ආධුනික/පරීක්‍ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්‍ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්‍ෂා කාලය අවසන් වීමෙන් පසු එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්‍ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැනෙතොත්, එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්‍ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම, එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—" නව ප්‍රවේශක නිලධාරීහු " යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද, එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදි ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

5. **අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. " ලාංකික " යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනකුට මද, ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඇතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදෑතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ සථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද, නැද්ද ' යි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයැදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්ට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ මුල පිටුවේ පළව ඇති රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසි කියවා බලන්න.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### සාත්තු සේවා හා දරකාරක්ෂණය පිළිබඳ කථිකාචාර්යී හා මේට්‍රන් තනතුරක්

බිඳුනුවැව කාන්තා ගොවිකම් පාසැලේ සාත්තු සේවා හා දරකාරක්ෂණය පිළිබඳ කථිකාචාර්යී හා මේට්‍රන් තනතුරක් සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

2. **වැටුප්.**—මේ තනතුරට අදාල වාර්ෂික වැටුප් පරිමාණය රුපියල් 1;344—72—1,992 ක් වේ.

3. **සේවා කොන්දේසි.**—

(i) මෙම තනතුර සථිරය. එහෙත් විශ්‍රාම වැටුප් රහිතය.

(ii) පත්වීම අවුරුදු තුනක පරීක්ෂා කාලයකට යටත් වේ.

(iii) තෝරාගනු ලබන අපේක්ෂිකාව දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අපේක්ෂිකාවක්ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) " ඒ " කොටස යටතේ හෝ " ඒ(1)ජ " කොටස යටතේ පොදු සාත්තු සේවා සහතිකය ලබා සිටිය යුතුය.

(ii) සිංහල භාෂාව සමග ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් හෝ ඉංග්‍රීසි භාෂාව සමග සිංහල ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත්ව සිටිය යුතුය.

**සංලක්ෂ්‍යය.**—ඉංග්‍රීසි කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්ව සාත්තු සේවාවට බඳවා ගනු ලැබූ අපේක්ෂිකාවන්ගේ අඩු තම අධ්‍යාපන සුදුසුකම වශයෙන් ඉංග්‍රීසි කණිෂ්ඨ සහතික පත්‍රය පිළිගනු ලබනවා ඇත.

(iii) සිංහල භාෂාවෙන් දේශනා පැවැත්වීමේ හැකියාවක් තිබිය යුතුය.

5. **වයස සීමාව.**—1959 අප්‍රේල් මස 20 වැනි දින වන විට අපේක්ෂිකාවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය. (දැනටමත් රාජ්‍යසේවා නියුක්තව සිටින අපේක්ෂිකාවන් කෙරෙහි මෙම වයස සීමාව බල පාන්නේ නැත.)

6. සෑම අපේක්ෂිකාවක්ම තම අයදුම් පතට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් අමුනා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකයේ පිටපත ;

(ආ) ලබාඇති උසස්තම අධ්‍යාපන සහතික පත්‍රයේ පිටපත ;

(ඇ) මෑතදී ලබාගත් චරිත සහතික තුනක පිටපත්.

7. පහත සඳහන් ආකෘති පත්‍රයට අනුකූල වනසේ පිළියෙල කරන ලද අයදුම් පත් 1959 අප්‍රේල් මස 20 වැනිදට හෝ ඊට පෙර පේරාදෙණියේ කෘෂිකර්ම අධ්‍යක්ෂක තුමා වෙත ලැබෙන්නට සැළැස්විය යුතුය.

අයදුම් පත් හෝ ඊට අදාල සෙසු සෑම ලියකියවිල්ලක්ම එවිය යුත්තේ කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා වෙතය. දෙපාර්තමේන්තුවේ අන් කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට අයදුම් පත් හා ලියකියවිලි නො එවිය යුතුය.

එම්. ඇf(1)ජ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1959 මාර්තු 13 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

## අයදුම්පතේ ආකෘති පත්‍රය

### යාත්තු සේවා හා දරකාරක්ෂණය පිළිබඳ කථිකාචාර්යී හා මේට්‍රන් තනතුර

1. (අ) සම්පූර්ණ නම :————.

(ආ) ලිපිනය :————.

2. උපන් දිනය හා ස්ථානය :————.

3. ජාතිය :————.

4. ලබා ඇති උසස්තම අධ්‍යාපන හා කාර්මික සුදුසුකම් :————. (සමත්ව ඇති විෂයයන් කවරේදැයි සඳහන් කරන්න.)

5. උගැන්වීමේ පළපුරුද්ද හා සාත්තු සේවා දරකාරක්ෂණය පිළිබඳ පළපුරුද්ද :————.

6. සිංහලයෙන් දේශන පැවැත්වීමේ හැකියාවක් තිබේද ? : ————.

7. වෙනත් විස්තර :————.

මවිසින් මෙම අයදුම් පතෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මේ අයදුම් පතෙහි කිසියම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් මා එයින්ම නුසුදුසු වන බවත් තෝරා ගැනීමෙන් පසු ඒ බව දැනගන්නට ලැබුනහොත් කිසිම වන්දියක් නොගෙවා මා රාජකාරියෙන් පහකර දැමීමට යටත් වන බවත් මම දැනසිටිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

පේරාදෙණියේ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා වෙතටයි.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### සත්ව පාලනය පිළිබඳ උපදේශිකා තනතුරක්

යාපනේ තින්නවලි ගොවිකම් පාසැලෙහි සත්ව පාලනය පිළිබඳ උපදේශිකා තනතුරක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. වැටුප.—මේ තනතුරට අදාල වාර්ෂික වැටුප් පරිමාණය රුපියල් 918—42—1,464 ක් වේ.

3. සේවා කොන්දේසි.—

(i) මෙම තනතුර ස්ථිරය. එහෙත් විශ්‍රාම වැටුප් රහිතය.

(ii) පත්වීම අවුරුදු 3 ක පරීක්ෂා කාලයකට යටත් වේ.

(iii) තෝරා ගනු ලබන අපේක්ෂිකාව දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සූදානම් ව සිටිය යුතුය.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අපේක්ෂිකාවක්ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) දෙමළ භාෂාව සමග ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය ;

(ආ) කුණ්ඩසාලයේ කාන්තා කෘෂිකර්ම විද්‍යාලයේදී කෘෂිකර්මය පිළිබඳ දැවුරුද්දක පාඨ මාලාවක් සාර්ථක ලෙස අවසන් කොට ලබාගත් සහතික පත්‍රය ;

(ඇ) දෙමළ භාෂාවෙන් දේශන පැවැත්වීමේ හැකියාවක් තිබිය යුතුය.

5. වයස සීමාව.—1959 අප්‍රේල් මස 20 වැනි දින වන විට අපේක්ෂිකාවන්ගේ වයස අවුරුදු 22 කට අඩු නොවිය යුතු අතර අවුරුදු 45 කට වැඩි නොවිය යුතුය.

6. සෑම අපේක්ෂිකාවක්ම තම අයදුම් පතට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් අමුනා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකයේ පිටපත ;

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතික පත්‍රයේ පිටපත ;

(ඇ) ලබා ඇති උසස්තම කාර්මික සහතික පත්‍රයේ පිටපත ;

(ඈ) මෑතදී ලබාගත් චරිත සහතික පත්‍ර තුනක පිටපත්.

7. පහත සඳහන් ආකෘති පත්‍රයට අනුකූල වනසේ පිළියෙල කරන ලද අයදුම් පත් 1959 අප්‍රේල් මස 20 වැනි දිනට හෝ ඊට පෙර පේරාදෙණියේ කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා වෙත ලැබෙන්නට සැලැස් විය යුතුය.

අයදුම් පත් හෝ ඊට අදාල සෙසු සෑම ලියකියවිල්ලක්ම එවිය යුත්තේ කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා වෙතය. දෙපාර්තමේන්තුවේ අන් කිසිම නිලධරයෙකුගේ පෞද්ගලික නමට අයදුම් පත් හෝ වෙනත් ලියකියවිලි නොයැවිය යුතුය.

මේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡෙදයේ මුල් පිටුවේ පළව ඇති රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසි කියවා බලන්න.

එම්. ඒ. ජේ. චන්ද්‍රරත්න,
කෘෂිකම් අධ්‍යක්ෂ.

1959 මාර්තු 17 වැනි දින,
කෘෂිකම් දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

### අයදුම්පතේ ආකෘති පත්‍රය

#### සත්ව පාලනය පිළිබඳ උපදේශිකා තනතුර

1. (අ) සම්පූර්ණ නම :————.
   (ආ) ලිපිනය :————.

2. උපන් දිනය හා ස්ථානය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

3. ජාතිය :————.

4. ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම :————.
   (සමත්ව ඇති විෂයයන් කවරේදැයි සඳහන් කරන්න.)

5. ලබා ඇති උසස්ම කාර්මික සුදුසුකම :————.

6. උගැන්වීමේ පළපුරුද්දක් තිබේද යන වග :————.

7. ද්‍රවිඩ භාෂාවෙන් දේශන පැවැත්වීමේ හැකියාවක් තිබේද ? : ————.

8 වෙනත් විස්තර :————.

මවිසින් මෙම අයදුම් පතෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මේ අයදුම් පතෙහි කිසියම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් තිබුණු බව, තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් මා එයින්ම නුසුදුසු වන බවත් තෝරා ගැනීමෙන් පසුව ඒ බව දැන ගන්නට ලැබුනහොත් කිසිම වන්දියක් නොමැතිව මා රාජකාරියෙන් පහකර දැමීමට යටත් වන බවත් මම දනිමි.

————,
අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

පේරාදෙණියේ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා වෙතටයි.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### රජයේ (සිංහල) අභ්‍යාස විද්‍යාලයයන්හි අභ්‍යාස ආචාර්ය/අභ්‍යාස ආචාරිණී තනතුර

රජයේ අභ්‍යාස විද්‍යාලයයන්හි අභ්‍යාස ආචාර්ය/අභ්‍යාස ආචාරිණී තනතුර සඳහා 1959 අප්‍රියෙල් මස 24 වැනි දින හෝ ඊට කලින් කොම්පොඤ්ඤවීදියේ, මලයි වීදියේ අධ්‍යාපන කාර්යාලයේ ටී. සී. ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—මේ තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 3,060—120, 180 සහ 240—5,820ක් වේ.

3. අවශ්‍ය අධ්‍යාපන හා අනිත් සුදුසුකම්—

(i) ධූරාපෙක්ෂකයන් උපාධිය ලැබීමෙන් පසු තුන් අවුරුදු ඉගැන්වීමේ පලපුරුද්දක් ඇති උපාධිධරයන් හෝ පුහුණුවීමෙන් පසු යටත්පිරිසෙයින් පස් අවුරුදු ඉගැන්වීමේ පලපුරුද්දක් ඇති මිතීයික පුහුණු ශික්ෂකයන් හෝ විය යුතු ය. ධූරාපේක්ෂකයාට ගණිතය ඉගැන්විය හැකි විය යුතුය. පොදු අධ්‍යාපන සහතික පත්‍ර විභාගයේ දී (උසස් තත්ත්වය) හෝ ඊට උසස් විභාගයක දී ගණිතයෙන් සමත් වූ ද අතිරේක වශයෙන් අධ්‍යාපනය හෝ සිංහල භාෂාව ඉගැන්විය හැකි වූද ධූරාපේක්ෂකයන්ට වැඩි සැලකිලි දක්වනු ලැබේ.

(ii) 59.4.24 වැනි දිනට ධූරාපෙක්ෂකයන් වයසින් අවුරුදු 25ට අඩු හෝ 50ට වැඩි හෝ නොවිය යුතු ය. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් සම්බන්ධයෙන් වැඩි වයස් සීමාව නොයෙදේ.

(iii) තෝරාගනු ලබන ධූරාපෙක්ෂකයා දැනටම රජය යටතේ ස්ථිර තනතුරක් දරන්නේ නැත්නම්, අවුරුදු 3ක ප්‍රවාසන කාල පරිච්ඡේදයකට යටත්ව පත්කරනු ලැබේ.

4. විශේෂ කොන්දේසි—

(i) තෝරාගනු ලබන ධූරාපේක්ෂකයා පළමුවරට පොල්ගොල්ලේ අභ්‍යාස විද්‍යාලයට පත්කරනු ලැබේ. එහෙත් ස්ථාන මාරු කර යැවීමට යටත් ය.

(ii) නියමිත පෝරමයෙහි ලියා සම්පූර්ණකර ඉල්ලුම් පත්‍ර එවිය යුතු ය. ආදර්ශ පෝරමය මෙහි පහත දී ඇත. පෝරම මේ කාර්යාලයෙන් සපයනු නොලැබේ. එහෙත් දැන්වීමේ දී තිබෙන ආදර්ශ පෝරමය ධූරාපේක්ෂකයන් විසින් පිටපත් කර ගත යුතු ය.

(iii) පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ තනතුර විශ්‍රාම වැටුප් සහිත ය. මෙම තනතුර සඳහා තෝරා ගැනීමට පෙර විශ්‍රාම වැටුප් වාර්තා යටතේ ශික්ෂකයකු වශයෙන් විශ්‍රාම වැටුප් හිමියකු පත් කරනු ලැබුවහොත් ඔහු/ඇය මේ තනතුර දරන තෙක් මේ තනතුර විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශ කරනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡෙදය පටන් ගැන්මේ ප්‍රසිඬ කර තිබෙන, මහජන සෙවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි ද බලනු මැනවි.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපනාධ්‍යක්ෂ වෙනුවට.

අංකය : ටී. සී. සී. 2635.
1959 මාර්තු මස 30 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

### ආදර්ශ පෝරමය

**පොල්ගොල්ලේ රජයේ අභ්‍යාස විද්‍යාලයේ අභ්‍යාස ආචාර්ය/අභ්‍යාස ආචාරිණී තනතුර පිළිබඳ ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. 59.4.24 වැනි දිනට නිවැරදි වයස :—අවුරුදු —— මාස —— දින ———.
4. ජාතිය හා එය ලබාගත් ආකාරය :————.
5. උපන් ස්ථානය—
 (අ) ඉල්ලුම්කරු :————.
 (ආ) ඇගේ/ඔහුගේ පියා :————.
 (ඉ) ඇගේ/ඔහුගේ පියාගේ පියා :————.
 (ඊ) ඇගේ/ඔහුගේ පියාගේ පියාගේත් පියා :————.
6. ශාස්ත්‍රීය සුදුසුකම් හා ඒවා ලබාගත් දින :————. (ලබා තිබෙන උසස්ම අධ්‍යාපන සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතුයි).
7. වෘත්තීය සහතික පත්‍ර :————.
8. ඉගෙනීම ලැබූ පාඨශාලා හා විද්‍යාල (ඇතුළත් වූ හා අස් වූ දින සඳහන් කළ යුතුයි) :————.
9. ඉගැන්වීමේ පළපුරුද්ද (මෙහි පහත සඳහන් කර තිබෙන අයුරු විස්තර සපයන්න) :————.

පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම : ————.

ඇතුළත් වූ දිනය : ————.

අස්වූ දිනය : ————.

දරූ තනතුර : ————.

සේවා කාලය : අ.——මා.——දින——.

අස්වීමට හේතුව : ————.

මුළු ගණන : ————.

———

10. සිංහලෙන් ලබා තිබෙන සුදුසුකම් :————.
11. කල් ක්‍රියාව පිළිබඳ සහතික පත් ලබාගත් අයගේ (ඤාතීන් නොවෙයි) නම් හා නිලතල :————.
 (මෑතදී ලබාගත් චරිත සහතික පත්‍ර තුනක පිටපත් (මුල් පිටපත් නොවෙයි) ඇමිණිය යුතුය. රජයේ සේවයේ නියුක්තයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය.)
12. අනිත් සුදුසුකම් :————.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් ලියා තිබෙන බව තේරීමට කලින් අනාවරණය වුවහොත් මා එයින්ම නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව, තේරීමෙන් පසු ඒ බව දන ගන්නට ලැබුනොත් කිසිම වන්දියක් රහිතව, මා රාජකාරියෙන් පහකර දැමීමට යටත්වන බව ද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

———

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

**ජ්‍යෙෂ්ඨ ශුභ සාධක නිලධාරි තනතුරු**

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ ශුභ සාධක නිලධාරි තනතුරු සඳහා ඇබෑර්තු දෙකකට ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගත් ඉල්ලුම් පත්‍ර අපේක්ෂකයින් විසින් තම අත් අකුරින්ම පුරවා "බන්ධනාගාර කොමසාරිස්, බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 9" යන ලිපිනයට 1959 අප්‍රේල් මස 21 වෙනි දිනට හෝ ඊට ප්‍රථම එවිය යුතුයි. පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර සපයනු නො ලැබේ.

**ස. ද.**—ඉල්ලුම් පත්‍ර බහා එවනු ලබන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "ජ්‍යෙෂ්ඨ ශුභ සාධක නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුයි. ඉල්ලුම් පත්‍ර ලැබුණු වග දැනුම් දෙනු නොලැබේ.

2. **වැටුප් ක්‍රමය සහ දීමනා.**—මෙම තනතුරු සඳහා රු. 3,900 න් පටන් ගෙන රු. 180 බැගින් රු. 5,340 දක්වා නඟින වාර්ෂික වැටුප් ක්‍රමයක් නියමිතය. ගෙවල් කුලී සහ ජීවනාධාර රජයේ නියමිත ගණන් අනුව ගෙවනු ඇත.

3. **සේවයේ කොන්දේසි.**—
 (අ) මෙම තනතුරු ස්ථිරය. එහෙත් විශ්‍රාම වැටුප් රහිතය. රජයේ සේවකයින් ගේ අර්ථ සාධක අරමුදලට දායක විය යුතුයි.
 (ආ) පත්වීම් දෙනු ලබන්නේ තුන් අවුරුදු පරීක්ෂණ කාල පරිච්ඡේදයකට යටත් කොටය.
 (ඇ) තවදුරටත් සේවයේ යෙදවීමට නුසුදුසු යයි හැඟේ නම් පරීක්ෂණ කාලපරිච්ඡේදය ඇතුළතදී කිසිම හේතුවක් ප්‍රකාශ නොකොට පත්වීම අවලංගු කිරීමට බන්ධනාගාර කොමසාරිස්ට බලය ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අපේක්ෂකයෙක්ම තමන්ට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—
 (අ) ලාංකිකයකු විය යුතුයි.
 (ආ) වයස අවුරුදු 24 ට නොඅඩු සහ 36 ට නො වැඩි විය යුතුයි.
 (ඇ) පිළිගත් සරසවියක අන්තර් පරීක්ෂණයෙන් හෝ ලක් සරසවියේ කලා හෝ විද්‍යා පිළිබඳ ප්‍රථම පරීක්ෂණයෙන් සාමාර්ථය,
 හෝ
 ජ්‍යෙෂ්ඨයෙන් සාමාර්ථය ලත් පිළිගත් ආයතනයකින් ලබාගත් සමාජ විද්‍යාව පිළිබඳ සහතිකයක් හෝ ඩිප්ලෝමාවක් ඇති අය විය යුතුයි
 (ඈ) හොඳ ශරීරයකින් යුතු විය යුතුයි. අඩුම උස අඩි 5 අඟල් 4 සහ සාමාන්‍ය පපුවේ මහත අඟල් 32 විය යුතුයි.

**ස.ද :**—සමාජ සේවා වැඩ පිළිබඳ සුදුසුකම් හෝ පළපුරුද්ද ඇති අපේක්ෂකයින් ගැන විශේෂයෙන් සලකා බලනු ලැබේ.

5. අපේක්ෂකයින් විසින් තම ඉල්ලුම් පත්‍ර වලට පහත සඳහන් සහතික වල පිටපත් ඇමිණිය යුතුයි. මුල් සහතික එවීම අනවශ්‍යය :—
 (අ) උප්පැන්න සහතිකය.
 (ආ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.
 (ඇ) ලඟදී ලබාගත් චරිත සහතික තුනක්.

6. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදය ආරම්භයේ එන රාජ්‍ය සේවාවේ තනතුරු වලට අදාලවන පොදු කොන්දේසි බලනු මැනවි. සියළු අයුරින්ම මෙම නිවේදනයේ ප්‍රකාර නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5 වන ඡේදයේ ප්‍රකාර සුදුසුකම් ඇතිව 58. 11. 17 වන දින ආණ්ඩුවේ ගැසට් නිවේදනයේ අනුව ඉල්ලුම් පත් ඉදිරිපත් කළ අපේක්ෂකයන් නැවත ඉල්ලුම් පත්‍ර එවීම අනවශ්‍යයි.

වී. ඇන්. පිල්ලේ,
බන්ධනාගාර කොමසාරිස්.

1959 මාර්තු 23 වැනි දින,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 9,

### බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ ශුභ සාධක නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් කිරීම

ඉල්ලුම් පත්‍රය සමග එවිය යුත්තේ සහතික වල පිටපත් මිස මුල් සහතික නොවේ. එවනු ලබන මුල් සහතික පිළිබඳව වගකීම දෙපාර්තමේන්තුව භාර නො ගන්නා අතර ඒවා ආපසු එවීමටද බැඳී නො සිටී.

1. සම්පූර්ණ නම :————.
 (පැහැදිලි අකුරින්).
2. ස්ථිර ලිපිනය :————.
3. උපන් දිනය සහ 1958. 12. 9. දිනට වයස :————.
4. (අ) ඉල්ලුම්කරුගේ උපන් ස්ථානය :————.
 (ආ) ඉල්ලුම්කරුගේ පියාගේ උපන් ස්ථානය :————.
 (ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා උපන් ස්ථානය :————.
 (ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේත් පියා උපන් ස්ථානය : ————.
5. ජාතිය :————.
6. කසාද බැඳලාද නැද්ද යන වග :————.
7. උස සහ පපුවේ මහත පිළිබඳ විස්තර—
 (අ) උස :————.
 (ආ) පපුවේ මහත :————.
8. අධ්‍යාපන සුදුසුකම්—
 (අ) සිංහල :————.
 (ආ) ඉංග්‍රීසි :————.
 (ඇ) දෙමළ :————.

9. ක්‍රීඩා සහ මල්ලව ක්‍රීඩා පිළිබඳ යම් සුදුසුකමක් ඇත් නම් ඒ පිළිබඳ විස්තර සහ ආරක්ෂක හමුදාවේ හෝ සෙවනා සේවක හමුදාවේ හෝ සේවයක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර (සහතික පිටපත් ඇමිණිය යුතුයි) :————.

10. ඔබ සරඹ ක්‍රීඩා පිළිබඳ හෝ ශරීර ව්‍යායාම පිළිබඳ හෝ අභ්‍යාස පංතියක් අනුගමනය කළා නම් ලබා ඇති දැනුම පිළිබඳ විස්තර සපයනු :————.

14. සමාජ සේවා වැඩ පිළිබඳ සුදුසුකම් හෝ පළපුරුද්ද (සහතික වල පිටපත් ඇමිණිය යුතුයි) :————.

12. දැනට රැකියාවක් ඇතොත්, ඒ කුමක් ද යන වග :————.

13. චරිත සහතික එවනු ලබන්නේ කාගෙන්ද යන වග සහ ඔවුන්ගේ ලිපිනයන් :————.

14. පාසලින් අස්වූදා සිට කරන ලද රැකියාවන් පිළිබඳ විස්තර : ————.

ස්වාමියාගේ නමත්, කොතෙක් කල් සේවය කළේද යන වගත් සඳහන් කරනු. අපේක්ෂකයා රජයේ සේවයේ සිටියේ නම් හෝ දැනට රජයේ සේවයේ යෙදී සිටී නම් හෝ ඒ පිළිබඳ විස්තර සැපැයිය යුතුයි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

## වන සංරක්ෂක දෙපාර්තමේන්තුව

### ෆෝර්මන් තනතුරක (කැපීම් යන්ත්‍ර) ඇබෑර්තුවක්

මෙම දෙපාර්තමේන්තුවේ කැපීම් යන්ත්‍ර (ඉන් සයිසින් ප්ලාන්ට්) පිළිබඳ ෆෝර්මන් තනතුරක් සඳහා පහත පෙනෙන ආකෘති පත්‍රය අනුව පිළියෙළ කරන ලද අයදුම් පත්, 1959 මැයි මස 14 වැනි දින දක්වා භාරගනු ලැබේ. එකී අයදුම් පත් මගේ පුද්ගලික නමට නොව, වන සංරක්ෂක, තැ. පෙ. අංක 509, කිව් පාර, කොළඹ 2, යන ලිපිනයට එවිය යුතුයි.

2. **වැටුප්.**—මෙම තනතුරට අයත් වාර්ෂික වැටුප රුපියල් 1,320න් පටන් ගෙන රුපියල් 72 බැගින් වැඩිවී, රුපියල් 2,184න් අවසන් වේ. ආරම්භයේදී පත්වීම තුන් අවුරුදු පරීක්ෂණ කාල සීමාවකට භාජන කෙරේ.

3. **සේවා කොන්දේසි.**—තනතුර තාවකාලිකව හා විශ්‍රාම වැටුප් රහිතව පවතී. පොදු සේවක අර්ථ සාධක අරමුදලට මෙය ඇතුළත් කර ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම් කරුවෙකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) 1959 මැයි 14 වැනි දිනට වයස අවුරුදු 35 නොඉක්මවූ බවටත්,

(ආ) තමා විශිෂ්ඨ චරිතයකින් හා ශාරීරික සනීපයකින් යුක්ත බවටත්,

(ඇ) (i) ලංකා කාර්මික විද්‍යාලයේ යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව දෑවුරුදු පාඨමාලාව (සන්ධ්‍යා) පංති හැදෑරූ බව සහ

(ii) වැද්දුම්, බොයිලේරු සහ යාන්ත්‍රික වැඩවලට හුරු පුරුදුවූ පිළිගත් කර්මාන්ත ශාලාවක දෑවුරුද්දක මනා පළපුරුද්දක් ඇති බවටත්ය.

5. සෑම අයදුම්කරුවකුම තමාගේ අයදුම් පතට පහත සඳහන් සහතික පිටපත් (මුල් සහතික නොව) පමණක් ඇමිණිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බවුතිස්ම සහතික පත්‍ර හෝ උපකාත පාසැල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයන් සඳහා නිකුත් කරන ලද සහතික පත්‍ර භාරගනු නොලැබේ).

(ආ) ලබාගත් උසස්ම ශාස්ත්‍රීය හා වෘත්තීය සහතික පත්‍රය.

(ඇ) තම සුදුසුකම්, චරිතය හා මෙම තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාවය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික පත්‍ර තුනක් (රාජ්‍ය සේවයෙහි නියුක්ත වුවනට මෙම උප වගන්තිය යටතේ සහතික පත්‍ර උවමනා නොකෙරේ.)

6. සම්මුඛ පරීක්ෂණයක් සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන් මෙම කාර්යාලයට කැඳවනු ලැබේ. මේ පිළිබඳව වියහියදම් තමන් විසින්ම දැරිය යුතුයි.

7. රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්කිරීම් පිළිබඳ පොදු කොන්දේසි, මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡෙදයේ මුල පලවී ඇති විස්තරයන්ගෙන් දැනගත හැක.

ජේ. එල්. ඊ. ප්‍රනාන්දු,
වන සංරක්ෂක.

1959 මාර්තු 23/28 වැනි දින,
කොළඹ 2, කිව් පාරේ පිහිටි වන සංරක්ෂක කාර්‍යාලයේ දීය.

### ආකෘති පත්‍රයයි

#### ෆෝර්මන් (කැපීම් යන්ත්‍ර) තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන් ලිවිය යුතුයි) :————.
(අ) පෙළපත් නාමය :————.
(ආ) වෙනත් නම් :————.

2. ලිපිනය :————.

3. (අ) 1959 මැයි මස 14 වැනි දිනට නියම වයස—
අවුරුදු :————; මාස :————; දින :————.
(ආ) උපන් දිනය සහ ස්ථානය (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුනා එවිය යුතුයි) :————.

4. ජාතිය සහ එය කෙසේ ලැබුනේද යන වග :————.

5. (අ) ඉල්ලුම්කරුගේ පියාගේ සම්පූර්ණ නම :————.
(ආ) ඔහු උපන් දිනය සහ ස්ථානය :————.
(ඇ) ඔහුගේ ජාතිය :————.

6. උපන් ස්ථානය—
(අ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශවයේ සීයාගේ :————.
(ආ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශවයේ මුත්තනුවන්ගේ :————.

7. ඉල්ලුම්කරු විවාහකද, අවිවාහකද යන වග :————.

8. අධ්‍යාපනය ලැබූ පාසැල සහ ඉන් අස්වූ දිනය :————.

9. අධ්‍යාපන සුදුසුකම් සහ අන්තිමට සමර්ථය ලත් විභාගයට ගනු ලැබූ විෂයයන් (දින සහිතව) :————.

10. කාර්මික පළපුරුදු :————.

11. පාසැලෙන් අස්වූ දා සිට කළ රක්ෂාවල් ලුහුඩින් ද සහ රජයේ කරන ලද සේවය ගැන සම්පූර්ණ විස්තර :————.

12. වෙනත් විශේෂ සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ තොරතුරු : ————.

13. යුධ හමුදාවක, සිවිල් ආරක්ෂක සේවයේ හෝ එවැනි සේවයක කළ සේවය පිළිබඳ විස්තර (සේවය කළ කාලය සඳහන් කොට, අස්වීයාමේ සහතික පත්‍රයේ පිටපතක් ඇමිනිය යුතුයි) :————.

14. තම චරිතය ගැන සහතික පත් දුන් තැනැත්තන්ගේ නම් සහ නිලතල (එම සහතික පත්‍රවල පිටපත් පමණක් එවිය යුතුයි) :————.

15. දැනට රක්ෂාවක නියුක්ත වුවහොත් එහි වගතුග :————.

මේ ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති කරුණු සත්‍ය බවටද නිවැරදි බවටද සහතික කරමි. තවද මෙහි සඳහන් කරුණු අසත්‍ය හෝ වැරදි සහගත යයි හෝරා පත් කරගත් පසුව හෝ පෙර හෝ දැනගත හොත් මා මේ තනතුර සඳහා නුසුදුස්සෙකු වන බවත් කිසිම වන්දි ආදියක් නැතිව සේවයෙන් පහකර හැරීමේ දඬුවමට යටත්වන බවත් මම හොඳින් දනිමි.

ඉල්ලුම්කරුගේ අත්සන :————.

දිනය :————.

## ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ 2 වන පෙළ ඉඩම් සංවර්ධන ඕවර්සියර් තනතුරු

ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඕවර්සියර් තනතුරු 13ක් සඳහා ඉල්ලුම් පත්‍ර 1959 අප්‍රියෙල් මස 30 වෙනි දින දවල් 12ට පෙර මේ කාර්යාලයට ලැබෙන සේ ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. මෙම තනතුරු ස්ථිරය, එමෙන්ම විශ්‍රාම වැටුප් සහිතය, අවශ්‍ය වූ විට ස්ථාන මාරු කිරීමේ කොන්දේසියට යටත්ව මෙම පත්වීම් දෙනු ලැබේ. තනතුරු සඳහා තෝරාගනු ලැබූ අයදුම්කරුවන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම කොටස ගෙවිය යුතුය.

3. රුපියල් 750න් පටන් ගෙන වර්ෂයකට රුපියල් 42 බැගින් අට (8) වසක් පඩි වැඩිවී රුපියල් 1,086 දක්වා නගින වාර්ෂික පඩි ක්‍රමයක් මේ තනතුර සඳහා ගෙවනු ලැබේ.

4. අයදුම්කරුවෝ 1959 අප්‍රියෙල් මස 30 වෙනි දිනට අවුරුදු 24 සම්පූර්ණ වූ එහෙත් 40 නොඉක්මවූ ලාංකිකයන් විය යුතුය. රජයේ දෙපාර්තමේන්තුවල සේවය කරන අයට මේ වයස් සීමාව අවශ්‍ය නැත.

5. පහත සඳහන් සුදුසුකම් අයදුම්කරුවන් සතු විය යුතුයි :—

(අ) පාඨශාලා කණිෂ්ඨ සහතික පත්‍ර විභාගය සිංහල (ඉංග්‍රීසි දැනුමත් ඇතිව) හෝ,

(ආ) පාඨශාලා කණිෂ්ඨ සහතික පත්‍ර විභාගය ඉංග්‍රීසි (සිංහල විෂය යක් වශයෙන්)

සහ

(ඇ) කෘෂිකර්ම පාඨශාලා පුහුණුවක් ලත් බවට සහතිකයක් හෝ ආහාර නිෂ්පාදන ඕවර්සියර් කෙනෙකු වශයෙන් දෙවසක (2) පළපුරුද්දක් ඇති බවට සහතිකයක්.

**සැළකිය යුතුයි.**—ඉඩම් කොමසාරිස් වරයාගේ දෙපාර්තමේන්තුවේ තාවකාලික ඕවර්සියර් කෙනෙකු වශයෙන් අවුරුදු 5ක පළපුරුද්දක් හා එම කාලය තුළ කරන ලද රාජකාරිය සහ මනා හැසිරීමකින් යුත්, සිංහල විෂයය සමග ඉංග්‍රීසි 7 වෙනි ප්‍රමාණයෙන් සමත් වූවෝ මෙම පත්වීම් ඉල්වීමට සුදුස්සෝය.

6. පත්වීම් තුන් අවුරුදු කාලයක පරීක්ෂාවට යටත්ව දෙනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් ලංකාවේ ඕනෑම තැනක රාජකාරිය කිරීමට පත්කරණු ඇත. ඔවුන් විසින් තම රාජකාරි කටයුතු සඳහා අනුමත කරන ලද වාහනයක් තබාගැනීම අවශ්‍ය වේ. ආණ්ඩුවේ මුදල් රෙගුලාසිවලට අනුකූලව ගමන් ගාස්තු ගෙවනු ලැබේ.

7. යම් වටිනාකමකින් යුත් ඇපයක් තබන ලෙස ආණ්ඩුව විසින් නියම කළ අවස්ථාවකදී ආණ්ඩුව විසින් අනුමත කළ අන්දමට ඒ ඇපය තැබීමට තෝරා ගත් අයදුම් කරුවන් සූදානම්ව සිටිය යුතුය.

8. සෑම අයදුම් පත්‍රයකම පහත සඳහන් විස්තරය සම්පූර්ණව සඳහන් විය යුතුය:—

(අ) අයදුම් කරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය :

(ආ) උපන් දිනය සහ වයස :

(ඇ) (1) අධ්‍යාපන සුදුසුකම් (සහතික පත්‍රයේ පිටපතක් අමුණා එවිය යුතුයි. (2) කෘෂිකාර්මික පුහුණුවෙන් සාමාර්ථය ලත් මධ්‍යස්ථානය සහ පුහුණුව ලැබූ කාල සීමාව. (සහතික පිට පතක් ඉල්ලුම් පත්‍රයට යාකොට එවිය යුතුය).

(ඈ) කෘෂිකාර්මික පළපුරුද්ද :

(ඉ) දැනට රක්ෂාවක් කරන්නේ නම්, රක්ෂාව සහ වැටුප් ප්‍රමාණය :

තවද සෑම අයදුම් කරුවෙක්ම මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක පිටපත් (මුල් කොපි නොවේ) ඉල්ලුම් පත්‍රයට යාකොට එවිය යුතුයි.

9. 1959 අප්‍රියෙල් මස 30 වෙනි දින දවල් 12ට පෙර කළුතර කච්චේරියේ ආණ්ඩුවේ ඒජන්ත තුමා වෙත ලැබෙන පරිදි ලියාපදිංචි කළ තැපෑලෙන් ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

10. සහතික පත්‍රවල පිටපත් මිස මුල් කොපි ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු නොවේ. ඉල්ලුම් පත්‍ර ලැබුන බව දන්වනු නො ලැබේ.

11. දැනට රජයේ සේවයේ නියුක්තව සිටින නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඔහුගේ නිර්දේශයත් සමග ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැති ඉල්ලුම් පත්‍ර භාර ගනු නොලැබේ.

ඒ. ඇම් ඇස්. පෙරේරා,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති තැන.

1959 මාර්තු 24 වෙනි දින,
කළුතර දිසාපති කාර්යාලයේදී ය.

---

## මාතලේ දිස්ත්‍රික්කයේ උතුරු මාතලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ කන්ද පල්ල කෝරළේ හා උඩුගොඩ පල්ලේසිය පත්තුවේ වැව්ලේකම් ධුරය

ඉහත සඳහන් ධුරය සඳහා කන්දපල්ල කෝරළේ සහ උඩුගොඩ පල්ලේසිය පත්තුවේ සථිර පදිංචි කරුවන්ගෙන් හා එම ප්‍රදේශයේ සථිර පදිංචිය ලැබ එහි නිශ්චල දේපල සතුව එම පලාත් වාසීන් ගෙන් සැලකිලි ලබන තත්ත්වයක සිටින්නාවූ අයවලුන්ගෙන් ඉල්ලුම්පත්‍ර භාරගනු ලැබේ. වී ගොවිතැන් කිරීමේ හා කුඹුරුවලට දිය බෙදාහැරීමේ මනා පලපුරුද්දක් ද ඉල්ලුම් කරුවන්ට තිබිය යුතුයි.

2. මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත සථිර තනතුරක්ය. මෙයට නියමිත වැටුප් ක්‍රමය වර්ෂයකට රුපියල් 540 න් පටන් ගෙන රුපියල් 12 හේ වාර්ෂික වැඩිවීම් වලින් රු. 804 දක්වා වැඩිවේ.

3. අපේක්ෂකයන්ගේ වයස අවුරුදු 25 ට නො අඩුවත් අවුරුදු 35 ට නො වැඩිවත් තිබිය යුතුයි.

4. අපේක්ෂකයින් කණිෂ්ඨ විභාගයෙන් හෝ ඊට වඩා උසස් විභාගයකින් සමර්ථවූවන් විය යුතුයි. ගොවිකම් අභ්‍යාස විද්‍යාල සහතික ලැබූවන්ගෙන් ඉහත සඳහන් අධ්‍යාපනික සුදුසුකම් අවශ්‍ය නොවේ.

5. අපේක්ෂකයන් යහපත් චරිත ඇත්තවුන් විය යුතුය.

6. සෑම ඉල්ලුම්පතකම අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, වයස, අධ්‍යාපනික සුදුසුකම් හා කෘෂිකම් පුහුණුව හා පලපුරුදු සඳහන් කල යුතුය.

පහත සඳහන් සහතික වලින් පිටපතක් බැගින් අයදුම් පත සමග එවිය යුතුයි :—

(1) උප්පැන්න සහතිකය.

(2) අධ්‍යාපනික සහතික.

(3) අයදුම්කරු පළමුවැනි ඡේදය අනුව එම කොට්ඨාශයේ පදිංචි කරුවකු බව සනාථ කිරීම සඳහා එම ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ සහතිකයක්.

(4) ළඟදී ලබාගත් චරිතය පිළිබඳ සහතික දෙකක්. (මෙම සහතික පිටපත් ආපසු එවනු නොලැබේ.)

7. අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට මාතලේ කච්චේරියේදී පෙනී සිටිය යුතුය. ඒ සඳහා ගමන් වියදම් හෝ වෙනයම් වියදම් ගෙවනු නොලැබේ.

8. තෝරාගනු ලබන ඉල්ලුම්කරු තුන් අවුරුදු සේවා සෝදිසියකට යටත්ව පත්කරනු ලැබේ.

9. අයදුම්පත් "දිසාපති, මාතලේ" යනුවෙන් සඳහන් කර එවිය යුතුයි. නිලධාරීන්ගේ පෞද්ගලික නම් වලට ඉල්ලුම් පත් නොඑවිය යුතුයි. අයදුම් පත් 1959 යේ අප්‍රේල් මස 18 වැනි දිනට පෙර එවිය යුතුයි. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

10. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ පටන්ගැන්මේ ප්‍රසිද්ධකර තිබෙන රජයේ සේවයේ තනතුරු වලට පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසිද බලනු මැනවි.

වී. පී. ඒ. පෙරේරා,
මාතලේ දිසාපති.

1959 මාර්තු 10 වැනි දින,
කච්චේරිය, මාතලේ.

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

භාණ්ඩාගාරයේ අංකය : 1/60/5(ජී).

## ටයිප් ගසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගය—මාර්තු 1958

අංක 11,645 හා 1959 ජනවාරි මස 23 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන්නට යෙදුන, 1959 ජනවාරි මස 20 වැනි දින දරණ නිවේදනය හා සම්බන්ධවයි. 1958 මාර්තු 15 වැනි දින පවත්වන්නට යෙදුන ටයිප් ගසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගයේ ප්‍රතිඵල අනුව පහත නම් සඳහන් අපේක්ෂක අපේක්ෂිකාවන් ද ටයිප් ගසන්නන්ගේ සේවයට පත්කර ගැනීමට තෝරා ගනු ලැබූ බව මෙයින් දැනුම් දෙමි :—

| නම | | ලිපිනය |
|---|---|---|
| කළුආරච්චි, අයි. | ... | "චන්ද්‍ර ගිරි", කඹුරුගමුව. |
| ගුණවර්ධන, එන්. ඩී. | ... | ඩී. ජේ. කුමාරගේ මහතා බාරේ, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, කොළඹ 7. |
| ගුණසේකර, ඩී. එම්. ඒ. | ... | අංක 43/3, කළුබෝවිල පාර, දෙහිවල. |
| ජයසේන, බී. | ... | සුමන විද්‍යායතනය, ගෝනාපීනුවල. |
| ජූලියස්, එස්. | ... | ග්‍රීන්ලන්ඩ්ස් විද්‍යාලයය, කොළඹ 5. |
| නවරත්න හාමිනේ, ඩබ්ලිව්. ජී. (මෙනෙවිය) | | තිබ්බොටුවාව, ඇහැලියගොඩ. |
| පෙරේරා, කේ. කේ. පී. (මෙනෙවිය) | ... | අංක 573, පන්සල පාර, මහරගම. |
| පෙරේරා, ජී. ජේ. (මෙනෙවිය) | | තැපැල්, ගුවන් විදුලි හා ප්‍රවෘත්ති ඇමති කාර්යාලයය, මහ ලේකම් ගොඩනැගිල්ල, කොළඹ. |
| මූණසිංහ, එම්. ඒ. ඩී. ඒ. (මෙනෙවිය) | ... | අධිකරණ අමාත්‍යාංශය, කොළඹ 12. |
| රොඩ්රිගෝ, බී. ජී. ඩබ්ලිව්. | ... | විභාග දෙපාර්තමේන්තුව, කොළඹ 2. |
| විල්ට්, අයි. ජී. | ... | ආරච්චි කන්ද, නික්කඩුව. |
| සිල්වා, ඒ. ඩබ්ලිව්. එම්. කේ. (මෙනෙවිය) | | අංක 99, අළුත් පාර, අම්බලන්ගොඩ. |
| සුවාරිස් සිංඤෝ, ජේ. එච්. | | දකුණු උඩුව, හොරණ. |
| හේරුස් සිංඤෝ, එල්. පී. | | දිවලකඩ, ගෝවින්න.|

2. ඉහත නම් සඳහන් අපෙක්ෂක අපේක්ෂිකාවන්ට පත්වීම් වහාම දීමට ආණ්ඩුව භාර ගන්නේ නැත. නමුත් ඇබෑර්තු ඇති වූ විට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ. පිරිමි අපේක්ෂකයින් තුන් අවුරුදු අස්ථිර පත්වීම් ඇතිව ද, අපේක්ෂිකාවන් තුන් අවුරුදු පරීක්ෂණ කාල සීමාවක් සහිතව ද පත් කෙරෙනු ඇත. සියළු අපේක්ෂක අපේක්ෂිකාවන් විසින්ම ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශාරීරික තත්ත්වයක් ඇද්දැයි සෙවීමේ වෛද්‍ය පරීක්ෂණයකින් සාමර්ථ්‍යය ලැබිය යුතුයි. තව ද, ඔවුන් ටයිප් ගසන්නන්ගේ සේවය පිළිබඳ කොන්දේසිවලට ද යටත් වෙනවා ඇත.

සී. ජී. එල්. මිසෝ,
වැඩ බලන භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1959 මාර්තු 31 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දී ය.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ගඩොල්, වැලි යනාදිය සැපයීම සහ ගෙනවිත් භාරදීම

කොළඹ 5, නාරාහේන්පිට ගොවිකම් කාර්‍යාලයෙහි කොළඹ දිස්ත්‍රික්කය භාර පරිපාලක නිලධාරි තැන විසින්, කළුතර බෝම්බුවල වී මධ්‍යස්ථානය භාර කළමනාකාර තැන වෙත පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සහ ගෙනවිත් භාරදීම සඳහා වෙන් වශයෙන් ටැන්ඩර් පත්‍ර 1959 අප්‍රේල් 24 වෙනි දින පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබෙයි :—

පිළිස්සූ ගඩොල් ($8\frac{3}{4} \times 4\frac{1}{4} \times 2\frac{3}{4}$) 50,000යි.

වැලි (ගංගා) කියුබ් 20යි.

කළු ගල් 9" කියුබ් 20යි.

කළු ගල් ½" කියුබ් 5යි.

2. කොළඹ 5, නාරාහේන්පිට, ගොවිකම් කාර්‍යාලයෙහි කොළඹ දිස්ත්‍රික්කය භාර පරිපාලන නිලධාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකක් සහිත ලියුම් කවරයක දමා සීල් තබා "කොළඹ දිස්ත්‍රික්කය භාර පරිපාලන නිලධාරි තැන, ගොවිකම් කාර්‍යාලය, නාරාහේන්පිට, කොළඹ 5" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කොනෙහි "බෝම්බුවල ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා ටෙන්ඩර් පත්‍රයය" යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින දාවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරනු ලබන්නේ ඉහත සඳහන් එක් එක් ද්‍රව්‍යය සඳහා ටෙන්ඩර් පත්‍රය වෙනුවෙන් රුපියල් 10 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියේ හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුය. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දස දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්නට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් කොළඹ 5, නාරාහේන්පිට, ගොවිකම් කාර්‍යාලයේ, කොළඹ දිස්ත්‍රික්කය භාර පරිපාලන නිලධාරිතැනට ඒවා ගෙනවිත් අතින්ම භාරදිය යුතුය. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයේ "බෝම්බුවල ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය.

ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලුම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දින සිට දින 4ක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු කොළඹ 5, නාරාහේන්පිට, ගොවිකම් කාර්‍යාලයෙහි පරිපාලන නිලධාරි තැන ගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුය.

5. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ දී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත යට කී දින යට කී වේලාවේ දී කොළඹ 5, නාරාහේන්පිට, ගොවිකම් කාර්‍යාලයෙහි පරිපාලන නිලධාරිතැන විසින් ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත ෆෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටු වී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන් වල ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන තැබිය යුතුය.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුය.

8. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් වූ ද පිළිගනු ලැබුවාවූ ද, දේවල මුළු වටිනාකමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත්, පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිම වූ විට පමණකි. පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු නොකළොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වනවාත් හැර ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ගණයට ඇතුලත් වෙනු ද ඇත.

9. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා දැරිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් කරන සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති 3කට වත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලු ටෙන්ඩර් පත්‍රයන් ප්‍රතික්ෂෙප කිරීමේ හෝ ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන සතුව ඇත.

12. පත්කර ගනු ලැබූ ටැන්ඩර්කරුවා විසින් එම ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් කාර්‍යයන් සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදිය යුතුවාත් හැර මෙම සැපයීම් සඳහා ටෙන්ඩර් කිරීමෙහි හැකියාව ඇත්තේ ද "ලාංකික" වන හවුකාරයන්ට හා වෙළඳ සමාගම්වලට පමණි. "ලාංකික" යන වචනයෙන් අදහස් කරනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවෙහි පුරවැසි භාවය ලත් බවය.

13. කොන්ත්‍රාත්කරු හට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුනහොත් හෝ ඔහු විසින් සඳහන් කොට ඇති ලිපියොමුවට තැපෑලෙන් යවනු ලැබුවහොත් ඔහු අතටම එවැන්න භාර දුන්නාක් කොට සැළකේ.

14. වර්ෂ 1934රේ අංක 19 දරණ කම්කරු වන්දි ආඥාපනතෙහි 117 වෙනි පරිච්ඡෙදය යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වග කීමෙන් කොන්ත්‍රාත්කරු ආණ්ඩුව නිදහස් කටයුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසු යැයි හැඟෙන යම් කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන එරෙහි වීමෙන් හෝ ඕනෑම කම්කරුවෙක් වැඩට ගැනීම ගැන විරුද්ධ වීමෙහි බලය රජය සතුව ඇත.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ රජයේ ලැයිස්තුවට තනිව හෝ එකී ලැයිස්තුවෙහි නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුලත් වූ හෝ තමාට සෑහේ යැයි පෙනී යන හේතූන් ප්‍රකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

17. වැඩි විස්තර, කොළඹ 5, නාරාහේන්පිට කෘෂිකර්ම කාර්‍යාලයෙහි පරිපාලන නිලධාරි තැනගෙන් ලබාගත හැක.

ඇම්. එෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

වර්ෂ 1959 මාර්තු මස 21 දින,
පේරාදෙණියේ දීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### අනුරාධපුර කැන්ගරු ට්‍රැක්ටර් මධ්‍යස්ථානයේ පී. ඩබ්ලිව්. ඩී. 3බී ගොඩනැගිලි (2) සෑදීම

කොළඹ යුනියන් පෙදෙසේ, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තුමා විසින් 15.5.59 වැනි දින පස්වරු 2.30 වන තෙක් ඉහත සඳහන් ගොඩනැගිලි සෑදීම සඳහා ගොඩනැගිලි 2 ට වෙනම ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ෆෝර්ම කොළ පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගන්නොරුවේ ඉංජිනේරු වැඩපලේ පරිපාලක නිලධාරි තැනගෙන් ලබාගෙන ඒවායෙහි ටෙන්ඩර් පත්‍ර ලියා එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් ද සහිතව ලියුම් කවරයක දමා සීල් තබා ඒ කවරයෙහි "සභාපති මහතා, ටෙන්ඩර් පත්‍ර මණ්ඩලය, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය, යුනියන් පෙදෙස, කොළඹ". යන්න ලියා එහි මුදුණේ වම් කෙළවරේ "අනුරාධපුර කැන්ගරු ට්‍රැක්ටර් මධ්‍යස්ථානයේ පී. ඩබ්ලිව්. ඩී. 3බී ගොඩනැගිලි සෑදීම සඳහා ටෙන්ඩරය" යන්නද ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. එසේ නැති නම් ඒවා රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. රෙජිස්ටර් තැපෑලෙන් නො එවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර් කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් හෝ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට බලය දී තිබෙන නිලධාරි තැන වූ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ සහකාර ලේකම් මහතාට භාර දිය යුතුයි. එම ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයෙහි "අනුරාධපුර කැන්ගරු ට්‍රැක්ටර් මධ්‍යස්ථානයේ පී. ඩබ්ලිව්. ඩී. 3බී ගොඩනැගිලි සෑදීම සඳහා ටෙන්ඩරය" යන්න ලියා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම දන්වනු ලැබේ. යම් ටෙන්ඩර් කරුවෙකුට එවැනි දැන්වීමක් ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමව තිබූ දින සිට දින 4 ක් ඇතුළත දී නොලැබුණේ නම් ඒ ගැන කොළඹ යුනියන් පෙදෙසේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම විමසිය යුතුයි.

5. මෙම ගොඩනැගිලි සඳහා රුපියල් 30,000කට වඩා ආණ්ඩුවේ ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් 15.5.59 වැනි දින දවල් 12 වන තෙක් (සතියේ දිනයක පස්වරු 4 දක්වාද සෙනසුරාදා දිනයන්හි පස්වරු 12.30 දක්වාද) එක් ටෙන්ඩරයක් වෙනුවෙන් කච්චේරියක හෝ කොළඹ මුදල් භාණ්ඩාගාරයේ රු. 150ක මුදලක් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත් කරනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර පත්‍රය පිළිගත් බැව් දන්වා දස දිනයක් ඇතුළත දී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනවාත් හැර ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරනු ලැබේ.

6. නියමිත ෆෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති, කිසිම ටෙන්ඩර් පත්‍රයක් නියම ටෙන්ඩර් පත්‍රය ලෙස සලකනු නොලැබේ. ප්‍රමාණයන් (Rates) සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාක් මෙන්ම ඒවා සම්බන්ධයෙන් යම් කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සනද තැබිය යුතුවේ.

7. ටෙන්ඩර්කරුවන් තමන්ගේ ලිපිනය ඉතා පැහැදිළි අකුරෙන් ලියා එවිය යුතුය.

8. ටෙන්ඩර්කරුවන් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් මේ ගොඩනැගිලි සම්බන්ධ ප්ලෑන, දිග, පළල යනාදිය සහ පොරොන්දු පත්‍ර පිළිබඳ වැඩි විස්තර ලබා ගත යුතුයි. සෑම ටෙන්ඩරකරුවෙක්ම මේ ගොඩනැගිලි සෑදීමට අදහස් කරන ස්ථානය ප්‍රථමයෙන් බලා ටෙන්ඩර් පත්‍ර යැවුවොත් මැනවි.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද පිළිගනු ලැබුවා වූද වැඩෙහි මුළු වියදමෙන් සියයට 5ක ඇප මුදලක් කෘෂිකම් අධ්‍යක්‍ෂක තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කරනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිම වී තුන් මසක් ඇතුළත කොන්ත්‍රාත් කරුවාගෙන් යම්කිසි මුදලක් අය කර ගැනීමට නොතිබුණොත් පමණකි. පත් කරනු ලැබූ ටෙන්ඩර් කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළ හොත් ඔහුගේ ඇප මුදල රජසන්තක විය යුතුවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කළ යුතුද වේ.

10. පොරොන්දුපත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම පත් කරනු ලැබූ ටෙන්ඩර් කරු විසින් ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර බාරගැනීම නැවැත්වූ දින සිට සති හයක් යන තුරු ටෙන්ඩර කරුවන් තම ටෙන්ඩර පත්‍ර සැළකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

12. යම්කිසි ටෙන්ඩර පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර පත්‍ර හෝ ප්‍රතික්ෂේප කිරීමටද ටෙන්ඩර පත්‍රයක යම්කිසි කොටසක් පිළි ගැනීමටද බලය ආණ්ඩුවට තබා ගනු ලැබේ.

13. ටෙන්ඩර පත්‍රයේ සඳහන් වැඩට ලාංකික කම්කරුවන් ගැනීමට පත් කරනු ලැබූ ටෙන්ඩර කරුවාට නියම කරනු ලැබේ. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ රටවැසියෙක් ය යන්නයි.

14. තමාගේ යම්කිසි සේවකයෙකුගේ හෝ සේවකයෙකු වෙනුවෙන් 1934 ජේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥා පණත (117 වැනි පරිච්ඡෙදය) යටතේ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත් කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි .

15. මෙම ගොඩනැගිලි සෑදීමට තෝරා ගනු ලැබූ ටෙන්ඩර් කරුවන් විසින් හැකිතාක් දුරට එම වැඩය කරගෙන යෑමට වුවමනා කරන නුපුහුණු හා පුහුණු කම්කරුවන් එම ප්‍රදේශයෙන්ම බඳවා ගැනීමට පොරොන්දු විය යුතු අතර එම පැහැර හැරියේ නම් ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුල් කරන අතර ඔහුගේ වැඩ තහනම් කරනු ලැබේ. තවද, යම්කිසි අවස්ථාවක වැළැක් විය නොහැකි කරුණු කරණකොටගෙන මෙයින් වැළකීමට බලය කෘෂිකම් හා ආහාර අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තුමාගෙන් ලබා ගත යුතුයි. මෙය කෘෂිකම් අධ්‍යක්‍ෂ තුමාගේ මාර්ගයෙන් ලබා ගත යුතුයි. ලාංකික නොවූ කම්කරුවන් හෝ එම ප්‍රදේශයෙන් බැහැර කම්කරුවන් මේ වැඩ කටයුතු සඳහා යෙදවීම කොන්ත්‍රාත්තුව පැහැර හැරියා වනවා ඇත. තවද, කොන්ත්‍රාත්කරුවා විසින් කෘෂිකම් අධ්‍යක්‍ෂ තුමා විසින් බලය දෙන ලද නිලධාරියෙකුට ඔහුගේ පොත් චැක්රෝල් යනාදිය බැලීමට ඉඩ දිය යුතුයි.

16. කොන්ත්‍රාත්කරුවාට භාර දිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහුගේ ලිපිනයට තැපෑලෙන් යැවුවහොත් නැත හොත් ඔහු ලියා දී තිබෙන ස්ථානයට ගෙනගොස් දුන්නොත් ඔහුට භාර දුන්නා කොට සැලකිය යුතුයි.

17. කෘෂිකම් අධ්‍යක්ෂ තැන විසින් සේවයට නුසුදුසු යයි නිගමනය කරන ලද කම්කරුවන් කොන්ත්‍රාත්කරුවා විසින් සේවයට නොගත යුතුයි.

18. තෝරා ගන්නා ලද ටෙන්ඩර් කරු විසින් ඇප කරුවන් දෙදෙනකු සොයාගෙන ඔහුගේ වියදමින්ම පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතුයි. එම ඇප කරුවන් කෘෂිකම් අධ්‍යක්ෂ තැන විසින් අනුමත කළ යුතුයි.

19. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නමක් සමග නම ඇතුළත් වූ හෝ තමාට සැහේයයි පෙනී යන හේතු පිට කෘෂිකම් අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

20. අසතුටුදායක වැඩ හා කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ඉටු නොකිරීමත් නිසා කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කෘෂිකම් අධ්‍යක්ෂ තැන වෙත තබා ගනු ලැබේ.

21. මේ පිළිබඳ වැඩි විස්තර පේරාදෙණියේ කෘෂිකම් දෙපාර්තමේන්තුවේ ගන්නොරුවේ ඉංජිනේරු වැඩපලේ පරිපාලන නිලධාරි තැනගෙන් ලබා ගත යුතුයි.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකම් අධ්‍යක්ෂ තැන.

1959 මාර්තු මස 26 වැනි දින
පේරාදෙනියේ දීය.

---

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### පොලොන්නරුවේ කෘෂිකම් මධ්‍යස්ථානයේ දුම්කොළ උදුන් "බාන්ස්" දෙකක් සෑදීම

1959 මාර්තු මස 13 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ දැන්වීම ගැනයි.

ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය 1959යේ අප්‍රේල් මස 24වෙනිදා පස්වරු 2.30 දක්වා කල් දමන ලදී. දුම්කොළ උදුන් "බාන්ස්" දෙක සාදා නිමකර භාරදිය යුතු දිනය ද 1959 ජූනි මස 25 වැනි දින දක්වා කල් දමන ලදී.

ටෙන්ඩර් පත්‍ර එදින දවල් 12 දක්වා ලබාගත හැක.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකම් අධ්‍යක්‍ෂක තැන.

1959 මාර්තු මස 27 වැනි දින,
පේරාදෙනියේ දීය.

---

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### ගඩොල් ආදිය සැපයීම

අනුරාධපුරයේ කැන්ගරු ට්‍රැක්ටර් ස්ථානයට ගඩොල් ආදිය සැපයීම සඳහා ටෙන්ඩර් සම්බන්ධව 1959 මාර්තු මස 6 වැනි දින රජයේ ගැසට් පත්‍රයෙහි පළ වූ දැන්වීම අවලංගු කළ බව මෙයින් දන්වමි.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකම් අධ්‍යක්‍ෂ.

1959 මාර්තු 26 වැනිදා,
පේරාදෙනියේදීය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### අනුරාධපුර කැන්ගරු ට්‍රැක්ටර් මධ්‍යස්ථානයේ පී. ඩබ්ලිව්. ඩී. 5බී ගොඩනැගිල්ල සෑදීම

කොළඹ යූනියන් පෙදෙසේ, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තුමා විසින් 1959.5.15 වැනි දින පස්වරු 2.30 වනතෙක් ඉහත සඳහන් ගොඩනැගිල්ල සෑදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. පෝර්ම කොළ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික වැඩපොලේ පරිපාලක නිලධාරි තැනගෙන් ලබාගෙන ඒවායෙහි ටෙන්ඩර් පත්‍ර ලියා එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් ද සහිතව ලියුම් කවරයක දමා සීල් තබා ඒ කවරයෙහි "සභාපති මහතා, ටෙන්ඩර් පත්‍ර මණ්ඩලය, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය, යූනියන් පෙදෙස, කොළඹ" යන්න ලියා එහි මුදුනේ වම් කෙළවරේ "කැන්ගරු ට්‍රැක්ටර් මධ්‍යස්ථානයේ පී. ඩබ්ලිව්. ඩී. 5 බී ගොඩනැගිල්ල සෑදීම සඳහා ටෙන්ඩරය" යන්න ද ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. එසේ නැත්නම් ඒවා රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. රෙජිස්ටර් තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර් කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් හෝ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට බලය දී තිබෙන නිලධාරි තැනවූ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ සහකාර ලේකම් මහතාට භාර දිය යුතුයි. එම ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයෙහි "කැන්ගරු ට්‍රැක්ටර් මධ්‍යස්ථානයේ පී. ඩබ්ලිව්. ඩී. 5 බී ගොඩනැගිල්ල සෑදීම සඳහා ටෙන්ඩරය" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. රෙජිස්ටර් තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම දන්වනු ලැබේ. යම් ටෙන්ඩර් කරුවකු විසින් එවැනි දැන්වීමක් ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමව තිබූ දින සිට දින හතරක් ඇතුළතදී නොලැබුනේ නම් ඒ ගැන කොළඹ යූනියන් පෙදෙසේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම විමසිය යුතුයි.

5. මෙම ගොඩනැගිල්ල සඳහා රු. 50,000කට වඩා ආණ්ඩුවේ ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් 1959.5.15 වැනි දින දවල් 12 වනතෙක් (සතියේ දිනයක පස්වරු 4 දක්වාද, සෙනසුරාදා දිනයන්හි පස්වරු 12.30 දක්වාද) එක් ටෙන්ඩරයක් වෙනුවෙන් කච්චේරියක හෝ කොළඹ මුදල් භාණ්ඩාගාරයේ රු. 150ක මුදලක් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත් කරනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර පත්‍රය පිළිගත් බැව් දන්වා දස දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර තැන්පත් මුදල රාජසන්තක කරනවාත් හැර ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරනු ලැබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති, කිසිම ටෙන්ඩර් පත්‍රයක් නියම ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ප්‍රමාණයන් (Rate) සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාක් මෙන්ම ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර කරුවාගේ කෙටි අත්සනද තැබිය යුතු වේ.

7. ටෙන්ඩර් කරුවන් තමන්ගේ ලිපිනය ඉතා පැහැදිලි අකුරෙන් ලියා එවිය යුතුයි.

8. ටෙන්ඩර් කරුවන් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් මේ ගොඩනැගිලි සම්බන්ධ ප්ලෑන, දිග, පළල යනාදිය සහ පොරොන්දු පත්‍ර පිළිබඳ වැඩි විස්තර ලබාගත යුතුයි. සෑම ටෙන්ඩර් කරුවෙක්ම මේ ගොඩනැගිලි සෑදීමට අදහස් කරන ස්ථානය ප්‍රථමයෙන් බලා ටෙන්ඩර් පත්‍ර යැව්වොත් මැනවි.

9. ටෙන්ඩර් පත්‍ර සඳහන්වූද පිළිගනු ලැබුවාවූද වැඩෙහි මුලු වියදමෙන් සියයට 5ක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීම ටත් පත් කරනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවී තුන් මසක් ඇතුළත කොන්ත්‍රාත් කරුවාගෙන් යම්කිසි මුදලක් අය කර ගැනීමට නොතිබුණොත් පමණකි. පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක විය යුතුවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කළ යුතුද වේ.

10. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් භාරගැනීම නැවැත්වූ දින සිට සති හයක් යන තුරු ටෙන්ඩර් කරුවන් තම ටෙන්ඩර පත්‍ර සැළකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

12. යම්කිසි ටෙන්ඩර පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර පත්‍ර හෝ ප්‍රතික්ෂෙප කිරීමටද ටෙන්ඩර පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමටද බලය ආණ්ඩුව තබා ගනු ලැබේ.

13. ටෙන්ඩර පත්‍රයේ සඳහන් වැඩට ලාංකික කම්කරුවන් ගැනීමට පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචිකරවා ගැනීමෙන් හෝ ලංකාවේ රටවැසියෙක් ය යන්නයි.

14. තමාගේ යම්කිසි සේවකයෙකුගේ හෝ සේවකයෙකු වෙනුවෙන් 1934රේ 19 වැනි අංකය දරන කම්කරු වන්දි ආඥපණත (117 වැනි පරිච්ඡේදය) යටතේ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වග කීමෙන් කොන්ත්‍රාත්කාරයා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. මෙම ගොඩනැගිලි සෑදීමට තෝරාගනු ලැබූ ටෙන්ඩර් කරුවන් විසින් හැකිතාක් දුරට එම වැඩය කරගෙන යෑමට වුවමනා කරන නුපුහුණු හා පුහුණු කම්කරුවන් එම ප්‍රදේශයෙන්ම බඳවා ගැනීමට පොරොන්දු විය යුතු අතර එය පැහැර හැරියේ නම් ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුල් කරන අතර ඔහුගේ වැඩ තහනම් කරනු ලැබේ. තවද යම්කිසි අවස්ථාවක වැළැක්විය නොහැකි කරුණු කරණකොට ගෙන මෙයින් වැළකීමට බලය කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තුමාගෙන් ලබාගත යුතුයි. මෙය කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමාගේ මාර්ග යෙන් ලබාගත යුතුයි. ලාංකික නොවූ කම්කරුවන් හෝ එම ප්‍රදේශ යෙන් බැහැර කම්කරුවන් මේ වැඩ කටයුතු සඳහා යෙදවීම කොන්ත්‍රාත්තුව පැහැර හැරියා වනවා ඇත. තවද කොන්ත්‍රාත්කරුවා විසින් කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා විසින් බලය දෙන ලද නිලධාරියකුට ඔහුගේ පොත්, චැක්රෝල් යනාදිය බැලීමට ඉඩ දිය යුතුයි.

16. කොන්ත්‍රාත්කරුවාට භාර දිය යුතු සියලුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහුගේ ලිපිනයට තැපැලෙන් යැවුව හොත් එසේ නැතහොත් ඔහු ලියා දී තිබෙන ස්ථානයට ගෙන ගොස් දුන්නොත් ඔහුට භාර දුන්නාකොට සැලකිය යුතුයි.

17. කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විසින් සේවයට නුසුදුසු යයි නිගමනය කරන ලද කම්කරුවන් කොන්ත්‍රාත්කරුවා විසින් සේවයට නොගත යුතුයි.

18. තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු විසින් ඇප කරුවන් දෙදෙනකු සොයා ගෙන ඔහුගේ වියදමින්ම පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතුයි. එම ඇප කරුවන් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විසින් අනුමත කළ යුතුයි.

19. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනකුගේ නමක් සමග නම ඇතුලුවූ හෝ තමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

20. අසතුටුදායක වැඩ හා කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ඉටු නොකිරීමත් නිසා කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන වෙත තබා ගනු ලැබේ.

21. මේ පිළිබඳ වැඩි විස්තර පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්ත මේන්තුවේ යාන්ත්‍රික වැඩපලේ පරිපාලන නිලධාරි තැනගෙන් ලබාගත යුතුයි.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන.

1959 මාර්තු මස 25 වැනි දින
පේරාදෙණියේ දීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### යාන්ත්‍රික අංශයට ගොඩනැගිලි සෑදීමට ගන්නා ද්‍රව්‍ය සැපයීම

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයට ගොඩනැගිලි සෑදීමට ගන්නා පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තුමා විසින් 1959 මැයි මස 15 වැනි දින 2.30 වනතෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ:—

1. ගඟේ වැලි කියුබ් 100.
2. 3/4" වානේ කියුබ් 50.
3. ඉතා හොඳ වර්ගයේ ඉංජිනේරු ගඩොල් 75,000.

2. පෝර්ම කොළ පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගන්නොරුවේ ඉංජිනේරු වැඩපලේ පරිපාලන නිලධාරි තැනගෙන් ලබාගෙන ඒවායෙහි ටෙන්ඩර් පත්‍ර ලියා එවිය යුතුයි. සියලුම ටෙන්ඩර පත්‍ර අනුපිටපතක් ද සහිතව ලියුම් කවරයක දමා සීල් තබා ඒ කවරයෙහි "සභාපති මහතා, ටෙන්ඩර් පත්‍ර මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙනිය" යන්න ලියා, එහි මුදුන් වම් කෙළවරේ "කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයට ගොඩනැගිලි සෑදීම සඳහා වුවමනා ද්‍රව්‍ය සඳහා ටෙන්ඩර්" යන්නද ලියැවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. එසේ නැති නම් ඒවා රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. රෙජිස්ටර් තැපෑලෙන් නො එවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් හෝ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට බලය දී තිබෙන නිලධාරි තැන වූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් ලිපිකරු මහතාට භාර දිය යුතුයි. එම ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයෙහි " කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයට ගොඩනැගිලි සෑදීම සඳහා වුවමනා ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් " යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද සඳහන් කළ යුතුයි. රිජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම දන්වනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවකු විසින් එවැනි දැන්වීමක් ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමව තිබූ දින සිට දින 4ක් ඇතුළත දී නොලැබුණේ නම් ඒ ගැන පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම විමසිය යුතුයි.

4. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත යටකී වේලාවේදී පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී ඒවා විවෘත කරනු ලැබේ.

5. 1959 මැයි 15 වැනි දින දවල් 12 වන තෙක් සතියේ දිනක පස්වරු 4 දක්වා ද, සෙනසුරාදා දිනයන්හි පස්වරු 12.30 දක්වා ද, ටෙන්ඩරයක් වෙනුවෙන් කච්චේරියක හෝ කොළඹ මුදල් භාණ්ඩාගාරයේ හෝ රුපියල් 25/-ක මුදලක් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බැව් දන්වා 10 දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරනු ලැබේ.

6. නියමිත ෆෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති, කිසිම ටෙන්ඩර් පත්‍රයක් නියම ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාක් මෙන්ම ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සනද තැබිය යුතුවේ.

7. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද, පිළිගනු ලැබුවා වූද, වැඩෙහි මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂතැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණකි. පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක විය යුතුවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කළ යුතුද වේ.

8. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

9. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වූ දින සිට සති හයක් යන තුරු ටෙන්ඩර්කරුවන් තම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

10. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර හෝ ප්‍රතික්ෂෙප කිරීමටද, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමට ද බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

11. තමාගේ යම්කිසි සේවකයකුගේ හෝ සේවකයකු වෙනුවෙන් 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපණත (117 වැනි පරිච්ඡේදය) යටතේ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වග කීමෙන් කොන්ත්‍රාත්කාරයා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

12. කොන්ත්‍රාත්කරුවාට භාරදිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත්, නැතහොත් ඔහුගේ ලිපිනයට තැපෑලෙන් යැවුව හොත් එසේ නැතහොත් ඔහු ලියා දී තිබෙන ස්ථානයට ගෙන ගොස් දුන්නොත් ඔහුට භාර දුන්නා කොට සැලකිය යුතුයි.

13. කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විසින් සේවයට නුසුදුසු යයි නිගමනය කරන ලද කම්කරුවන් කොන්ත්‍රාත්කරුවා විසින් සේවයට නොගත යුතුයි.

14. තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු විසින් ඇපකරුවන් දෙදෙනකු සොයා ගෙන ඔහුගේ වියදමින් පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතුයි. එම ඇපකරුවන් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විසින් අනුමත කළ යුතුය.

15. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නමක් සමඟ නම ඇතුලුවූ හෝ තමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

16. අසතුටුදායක වැඩ හා කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ඉටු නො කිරීමත් නිසා කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන වෙත තබාගනු ලැබේ.

17. මේ පිළිබඳ වැඩි විස්තර පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගන්නොරුවේ ඉංජිනේරු වැඩපළේ පරිපාලන නිලධාරි තැනගෙන් ලබාගත හැක.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂක.

1959 මාර්තු මස 17 වැනි දින,
පේරාදෙනියේ දීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### අඹේපුස්සේ සත්ව ගොවිපළෙහි ශක්තිමත් කොන්ක්‍රීට් වලින් උස්ව තැනූ වතුර ටැංකියක් ඉදි කිරීම

කොළඹ යූනියන් පෙදෙසේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තුමා විසින් 1959.5.15 වැනි දින පස්වරු 2.30 වන තෙක් ඉහත සඳහන් වතුර ටැංකිය ඉදි කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ෆෝර්ම කොළ පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගන්නොරුවේ ඉංජිනේරු වැඩපළේ පරිපාලන නිලධාරි තැනගෙන් ලබාගෙන ඒවායෙහි ටෙන්ඩර් පත්‍ර ලියා එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක්ද සහිතව ලියුම් කවරයක දමා සීල් තබා ඒ කවරයෙහි " සභාපති මහතා, ටෙන්ඩර් පත්‍ර මණ්ඩලය, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය, යූනියන් පෙදෙස, කොළඹ " යන්න ලියා එහි මුදුනේ වම් කෙළවරේ " අඹේපුස්සේ සත්ව ගොවිපළෙහි ශක්තිමත් කොන්ක්‍රීට්වලින් උස්ව තැනූ වතුර ටැංකියක් ඉදි කිරීම සඳහා ටෙන්ඩරය " යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. එසේ නැති නම් ඒවා රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර් කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් හෝ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට බලය දී තිබෙන නිලධාරි තැන වූ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ සහකාර ලේකම් මහතාට භාර දිය යුතුයි. එම ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයෙහි " අඹේපුස්සේ සත්ව ගොවිපළෙහි ශක්තිමත් කොන්ක්‍රීට්වලින් උස්ව තැනූ වතුර ටැංකියක් ඉදි කිරීම සඳහා ටෙන්ඩරය " යන්න ලියා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම දන්වනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවකුට එවැනි දැන්වීමක් ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත දින සිට දින හතරක් ඇතුළතදී නොලැබුනේ නම් ඒ ගැන කොළඹ යූනියන් පෙදෙසේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම විමසිය යුතුයි.

5. මෙම ගොඩනැගිලි සඳහා රු. 30,000කට වඩා ආණ්ඩුවේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් 1959.5.15 වැනි දින දවල් 12 වන තෙක් (සතියේ දිනක පස්වරු 4 දක්වා ද, සෙනසුරාදා දිනයන්හි පස්වරු 12.30 දක්වා ද) එක් ටෙන්ඩරයක් වෙනුවෙන් කච්චේරියක හෝ කොළඹ මුදල් භාණ්ඩාගාරයේ රුපියල් 150 ක මුදලක් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත් කරනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බැව් දන්වා දස දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනවාත් හැර ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරනු ලැබේ.

6. නියමිත ෆෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටු වී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් නියම ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ප්‍රමාණයන් (Rates) සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාක් මෙන්ම ඒවා සම්බන්ධයෙන් යම් කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සනද තැබිය යුතු වේ.

7. ටෙන්ඩර් කරුවන් තමන්ගේ ලිපිනය ඉතා පැහැදිලි අකුරින් ලියා එවිය යුතුයි.

8. ටෙන්ඩර් කරුවන් පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් මේ වතුර ටැංකිය සම්බන්ධ ප්ලෑන, දිග, පළල යනාදිය සහ පොරොන්දු පත්‍ර පිළිබඳ වැඩි විස්තර ලබා ගත යුතුයි. සෑම ටෙන්ඩර් කරුවෙක්ම මේ වතුර ටැංකිය ඉදිකිරීමට අදහස් කරන ස්ථානය ප්‍රථමයෙන් බලා ටෙන්ඩර් පත්‍ර යැව්වොත් මැනවි.

9. ටෙන්ඩර් පත්‍ර සඳහන් වූද, පිළිගනු ලැබුවා වූද වැඩෙහි මුළු වියදමෙන් සියයට 5ක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කරනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිම වී තුන් මසක් ඇතුළත කොන්ත්‍රාත් කරුවාගෙන් යම්කිසි මුදලක් අයකර ගැනීමට නොතිබුණොත් පමණකි.

පත් කරනු ලැබූ ටෙන්ඩර් කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළ හොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක විය යුතුවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ද වේ.

10. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වූ දින සිට සති හයක් යනතුරු ටෙන්ඩර්කරුවන් තම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

12. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර හෝ ප්‍රතික්ෂෙප කිරීමටද ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමටද බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

13. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩට ලාංකික කම්කරුවන් ගැනීමට පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම්—පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ රටවැසියෙක් ය යන්නයි.

14. තමාගේ යම්කිසි සේවකයෙකුගේ හෝ සේවකයෙකු වෙනුවෙන් 1934රේ 19 වැනි අංකය දරණ කම්කරුවන්ගේ ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වග කීමෙන් කොන්ත්‍රාත්කාරයා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. මෙම වතුර ටැංකිය ඉදි කිරීමට තෝරාගනු ලැබූ ටෙන්ඩර් කරුවන් විසින් හැකිතාක් දුරට එම වැඩය කරගෙන යාමට වුවමනා කරන නුපුහුණු හා පුහුණු කම්කරුවන් එම ප්‍රදේශයෙන්ම බඳවා ගැනීමට පොරොන්දු විය යුතු අතර එය පැහැර හැරියේ නම් ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුල් කරන අතර ඔහුගේ වැඩ තහනම් කරනු ලැබේ. තවද, යම්කිසි අවස්ථාවක වැළැක්විය නොහැකි කරුණු කරණකොට ගෙන මෙයින් වැළකීමට බලය කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තුමාගෙන් ලබා ගත යුතුයි. මෙය කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමාගේ මාර්ග යෙන් ලබා ගත යුතුයි. ලාංකික නොවූ කම්කරුවන් හෝ එම ප්‍රදේශයෙන් බැහැර කම්කරුවන් මේ වැඩ කටයුතු සඳහා යෙදවීම කොන්ත්‍රාත්තුව පැහැර හැරියා වනවා ඇත. තවද, කොන්ත්‍රාත් කරුවා විසින් කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා විසින් බලය දෙන ලද නිලධාරි යෙකුට ඔහුගේ පොත්, චැක්රෝල් යනාදිය බැලීමට ඉඩ දිය යුතුයි.

16. කොන්ත්‍රාත්කරුවාට භාරදිය යුතු සියලුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහුගේ ලිපිනයට තැපෑලෙන් යැවුවහොත් එසේත් නැතහොත් ඔහු ලියා දී තිබෙන ස්ථානයට ගෙනගොස් දුන් නොත් ඔහුට භාර දුන්නා කොට සැලකිය යුතුයි.

17. කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විසින් සේවයට නුසුදුසු යයි නිගමනය කරන ලද කම්කරුවන් කොන්ත්‍රාත් කරුවා විසින් සේවයට නොගත යුතුයි.

18. තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු විසින් ඇප කරුවන් දෙදෙනකු සොයාගෙන ඔහුගේ වියදමින්ම පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතුයි. එම ඇප කරුවන් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විසින් අනුමත කළ යුතුයි.

19. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනකුගේ නමක් සමඟ නම ඇතුලු වූ හෝ තමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

20. අසතුටුදායක වැඩ හා කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ඉටු නොකිරීමත් නිසා කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන වෙත තබා ගනු ලැබේ.

21. මේ පිළිබඳ වැඩි විස්තර පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්ත මේන්තුවේ ගන්නොරුවේ ඉංජිනේරු වැඩපළේ පරිපාලන නිලධාරි තැනගෙන් ලබාගත යුතුයි.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1959 මාර්තු 26 වැනි දින,
පේරාදෙනියේ දීය.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

රුපියල් 13,000/-ට හෝ ඊට වැඩි ගණනකට හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් පාදුක්ක නුගේ අමුණ සෑදීම සඳහා 1959 අප්‍රේල් මස 27 වනදා පෙරවරු 11.30 දක්වා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර, කොළඹ කොටාරෝඩ් හි ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් භාරගනු ලැබේ.

වැඩි විස්තර හා සැලැස්ම බලා ගැනීම කරගත හැක්කේ පහත සඳහන් ස්ථානයෙනි. අනුපිටපතක් සමඟ එවිය යුතු ටෙන්ඩර් පත්‍ර අප්‍රේල් මස 24 වනදා සවස 4.30 වන තෙක් එම ස්ථානයෙන්ම ලබා ගත හැකිය. ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළි ගැනීමේ හෝ ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණයෙන්ම නොපිළි ගැනීමේ බලය හෝ රජය සතුය.

ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමේ දී ඒ සඳහා රුපියල් 25/-ක මුදලක් ලංකාවේ ඕනෑම කච්චේරියක තැන්පත් කළ බවට හෝ වේලුවන පාරේ වාරිමාර්ග කාර්යාලයේ තැන්පත් කළ බවට හෝ කුවිතාන්සි යක් ඉදිරිපත් කළ යුතුය.

ජේ. එච්. හෙන්ස්මන්,
උප ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන.

වාරිමාර්ග කාර්යාලය,
වේලුවන පාර,
කොළඹ 9.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මහනුවර කොට්ඨාශ භාර ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1959 අප්‍රේල් මස 22වෙනි බදාදා පෙරවරු 10 දක්වා මහඔය අමුණ බැඳීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 14,500ට අඩු නොවන ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. පිටපත් දෙකකින් යුක්ත වූ ටෙන්ඩර් පත්‍රිකා මහනුවර සහකාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගෙන ටෙන්ඩරය ඉදිරිපත් කළ යුතුය. ඔහුගේ කාර්යාලයේදී මේ වැඩය ගැන සියලු විස්තර සහ සැලැස්මවල් බලාගත හැක.

3. දැනට රජයේ කොන්ත්‍රාත් වැඩ භාරව ක්‍රියා කරන අය විසින් එම වැඩවල ප්‍රමාණය සහ ඒවා සතුටුදායක අන්දමින් කරගෙන යන බවට සහතික පත්‍ර ඒ ඒ වැඩ භාර නිලධාරීන්ගෙන් ලබාගෙන ඉදිරි පත් කළ යුතුයි.

4. වාරිමාර්ග කාර්යාලයේ හෝ කච්චේරියක රුපියල් 25ක මුදලක් තැන්පත් කොට ලබාගත් රිසිට්පත් ඉදිරිපත් කළ කොන්ත්‍රාත් කරුවනට පමණක් 3.4.59 දින සිට 20.4.59 දක්වා රාජකාරියට නියමිත දවස් සහ වේලාවලදී මහනුවර වාරිමාර්ග කාර්යාලයෙන් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු මධ්‍යම කොට්ඨාශය භාර අනුරාධපුරයේ වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් පහත දැක්වෙන වැඩ සඳහා 1959 අප්‍රියෙල් මස 22 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් ටැන්ඩර් භාරගනු ලැබේ :—

(අ) ප්‍රාදේශීය වාරිමාර්ග කාර්යාලය ගොඩනැගීම, නව නගරය, අනුරාධපුර ;

(ආ) මහකනදරාවට හැරීයන හැ. 1, දැ. 41 පමණ පාර ගල් දමා තාර දැමීම.

2. වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතු මෙම ටැන්ඩර් සඳහා දෙපාර්තමේන්තුවේ රු. 50,000කට හෝ වැඩි ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් සුදුස්සන් වෙත්.

3. සෑම ටැන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. මේ සඳහා පෝර්ම කොල සහ සියලු විස්තර මහකනදරාව වාරිමාර්ග ඉංජිනේරු තැන ගෙන් ලබා ගත හැකිය. 1959 අප්‍රියෙල් 6 වෙනි සඳුදා සිට අප්‍රියෙල් මස 18 වෙනි සෙනසුරාදා දක්වා පෝර්ම කොල දෙනු ලැබේ.

4. ටැන්ඩර් පෝර්ම දෙනු ලබන්නේ කච්චේරියක හෝ මහකනදරාව වාරිමාර්ග කාර්යාලයෙහි එක් සේවයකට රු. 25 බැගින් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කරන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ බවට සහතික පෙන්විය හැකි කොන්ත්‍රාත්කරුවන්ට පමණී.

5. දැනට රජයේ කොන්ත්‍රාත් වැඩ කරන ටැන්ඩර්කරුවන් ඒ වැඩ භාර නිලධාරීන්ගෙන් සතුටුදායක ලෙස වැඩ සිදුවෙන බවට සහතික ඉදිරිපත් කළ යුතුය.

6. ටැන්ඩර් භාර ගැනීම අවසන් කරන දින පෙරවරු 10.30ට අනුරාධපුර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් ටැන්ඩර් විවෘත කරනු බැලීමට ටැන්ඩර්කරුවන්ට පැමිණිය හැක.

ඩී. වී. ඒ. සේනාරත්න,
වාරිමාර්ග ඉංජිනේරු තැන.
මහකනදරාව.

1959 මාර්තු 24 වැනි දින,
මිහින්තලේ.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

බන්ඩාරවෙල ඌව කොට්ඨාශයේ ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1959 අප්‍රේල් 22 වෙනි බදාදා පූ. භා. 10 තෙක් පුනා වැව අළුත්වැඩියා කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. බදුල්ලේ වාරිමාර්ග ඉංජිනේරු තුමාගේ කායාලයෙන් ටැන්ඩර් පත්‍ර හා වැඩි විස්තර ලබාගත හැක.

3. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 25,000 හා ඊට වැඩියෙන් ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට රු. 25ක ටැන්ඩර් මුදලක් තැන්පත් කළ පසු ටැන්ඩර් පත්‍ර ලබාගත හැක. මේ සඳහා ටැන්ඩර් පත්‍ර 20.4.59 දින තෙක් නිකුත් කරනු ලැබේ.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

බන්ඩාරවෙල ඌව කොට්ඨාශයේ ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1959 අප්‍රියෙල් 22 වෙනි බදාදා පූ.භා. 10 තෙක් අම්බේවෙල ජලාශ ව්‍යාපාරයට යන පාර තැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. බදුල්ලේ වාරිමාර්ග ඉංජිනේරු තුමාගේ කායාලයෙන් ටැන්ඩර් පත්‍ර හා වැඩි විස්තර ලබාගත හැක.

3. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 හා ඊට වැඩියෙන් ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට රු. 25ක ටැන්ඩර් මුදලක් තැන්පත් කළ පසු ටැන්ඩර් පත්‍ර ලබාගත හැක. මේ සඳහා 20.4.59 දින තෙක් ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

---

## අලෙවි කිරීමේ දෙපාතීමේන්තුව

අලෙවිකිරීමේ දෙපාතීමේන්තුවට අයත් කොළඹ නාරාහේන්පිට පිහිටි පලතුරු ටින්වල ඇහිරීමේ කම්මාන්තශාලාවට අළුත් බෝතල තොගයක් සැපයීම පිණිස ටෙන්ඩර් පත්‍ර 1959 අප්‍රියෙල් 17 වෙනි සිකුරාද අ. භා. 2.30 වෙනතෙක් කොළඹ කොටුවේ චතැම් වීථියේ පිහිටි අලෙවිකිරීමේ කොමසාරිස් කායාලයේ අලෙවිකිරීමේ කොමසාරිස්තුමා විසින් භාරගනු ලැබේ.

කොළඹ කොටුවේ චැතැම් වීථියේ අඩක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ කොමසාරිස් කායාලයෙන් ටෙන්ඩර් පෝරම ලබාගෙන ටෙන්ඩර පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

1959 අප්‍රියෙල් 17 වැනි සිකුරාද දවල් 12 වෙනතුරු ටෙන්ඩර පෝරම අලෙවිකිරීමේ කොමසාරිස් කායාලයෙන් ලබාගතහැක.

වැඩි විස්තර කොළඹ කොටුවේ චැතැම් වීථියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ කොමසාරිස් කායාලයෙන් දැනගැනීමට පුළුවන.

ඩබ්ලිව්. ඩී. ඕ. තිලකරත්න,
අලෙවිකිරීමේ කොමසාරිස් වෙනුවට

1959 මාර්තු මස 31 වැනි දින,
අලෙවිකිරීමේ දෙපාතීමේන්තුව,
62, චැතැම් වීථිය, කොළඹ 1.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1959 අප්‍රියෙල් මස 17 වෙනි සිකුරාද පෙරවරු 10.30 වන තෙක් මහනුවර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

| පාසැලේ නම | කළයුතු වැඩය |
|---|---|
| (1) මහ./වලල මධ්‍ය විද්‍යාලය ... | ක්‍රීඩා භූමියක් තැනීම. |

සංලක්ෂ්‍යය : මහ = මහනුවර.

2. ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන කොන්ත්‍රාත් කරුවන් අංක 1 වැඩය සඳහා රු. 5,000කට හෝ ඉන් ඉහළ ගණනකට ප්‍රසිඩ වැඩ දෙපාතීමේන්තුවේ හෝ රු. 2,500කට හෝ ඉන් ඉහළ ගණනකට අධ්‍යාපන දෙපාතීමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී සිටිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ වර්ෂ 1959 අප්‍රියෙල් මස 16වෙනි බ්‍රහස්පතින්ද පස්වරු 3.30 වන තෙක් පමණකි. ටෙන්ඩර් පත්‍ර ලබාගැනීමට බලාපොරොත්තුවන අය අධ්‍යාපන අධ්‍යක්ෂතැනගේ කාර්යාලයේ (ඒ.සී. ශාඛාවේ) හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක වැඩය වෙනුවෙන් රු. 100ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් මහනුවර අධ්‍යාපන නිලධාරි තැනට ඉදිරිපත් කළ යුතුයි. චැක් පත්, මනි ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන අවස්ථාවේදී දැනට රජය යටතේ ඇති කොන්ත්‍රාත් සම්බන්ධව පහත සඳහන් පරිදි සහතිකයක් ටෙන්ඩර් කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුයි:—

| වැඩයේ නම | කොන්ත්‍රාත්තුවේ දිනය | කොන්ත්‍රාත්තුවේ මුළු ගණන | වැඩය අවසාන කිරීමට නියමිත දිනය (කල්දීම් සහිතව) | වැඩය සතුටුදයකද අසතුටුදයකද යන වග | දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ප්‍රධානතැනගේ අත්සන |
|---|---|---|---|---|---|
| | | | | | |

ඉහත සඳහන් වන්නේ ම විසින්/අප විසින් කොන්ත්‍රාත් ගෙන තිබෙන සියළුම වැඩවල සම්පූර්ණ විස්තරයක් බැව් සහතික කරමි/කරමු.

————.
ටෙන්ඩර් කරුගේ අත්සන.

දිනය :————.

4. ටෙන්ඩර් කරුවන් විසින් පූර්වෝක්ත 3 වෙනි ඡෙදයේ අසා තිබෙන විස්තර පිළිබඳ සම්පූර්ණ සත්‍යය සඟවා ප්‍රකාශ කිරීම කොන්ත්‍රාත්තුවක් ඕනෑම අවස්ථාවක අවලංගු කිරීමට ප්‍රමාණවත් වන බැව් සැලකිය යුතුයි.

5. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ වව්චර් කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් (ඇස්. ඩබ්ලිව්. ශාඛාවෙන්) හෝ මහනුවර අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත යුතුය. මුදල් තැන්පත් කිරීමේ වව්චර් නිකුත් කරනු ලබන්නේ දෙවන ඡෙදයේ සඳහන්වන මුදල් ප්‍රමාණයන් අනුව ලියාපදිංචිව ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

6. පූර්වෝක්ත 2 වෙනි ඡෙදයේ සඳහන් පරිදි අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්ම එවිය යුත්තේ දෙවන පිටපත කුත් සමගය. සියළුම විස්තර හා තොරතුරු මහනුවර අධ්‍යාපන නිලධාරි තැනගෙන් දැනගත හැකිය. සැලැස්ම ද එහිදී බලාගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් නොඑවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර අධ්‍යාපන කාර්යාල සහකාර නිලධාරි තැනට භාර දී, එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුය. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර් කරුගේ නමද ලිපිනය ද වැඩයේ නමද ලියා තිබිය යුතුයි.

7. වර්ෂ 1959 අප්‍රියෙල් මස 17 වෙනි සිකුරාදා පෙරවරු 10.30 ට මහනුවර අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට විවෘත කරන ස්ථානයෙහි සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන නිලධාරි තැන විසින් එක් එක් ටෙන්ඩරයේ මුළු ගණනද ප්‍රමාණයද ටෙන්ඩර්කරුගේ නමද පැමිණ සිටින අයට ඇසෙනසේ කියවනවා ඇත.

8. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබූ අවසාන දින සිට සති 6කට නොඅඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

9. වෙනත් අවශ්‍ය විස්තර මහනුවර අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් සම්බන්ධ ලියකියවිලිද මෙහිදී පරීක්ෂා කර බැලිය හැක.

10. වැඩය භාරගන්නා කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවනු ලබන සියළුම සේවකයින් ලාංකිකයින් විය යුතුවා පමණක් නොව වැඩය කෙරෙන ප්‍රදේශයෙන්ම ඔවුන් තෝරාගැනීමට සෑම උත්සාහයක්ම ගත යුතුය. ලාංකික වූ හා වැඩ කෙරෙන ප්‍රදේශයෙහි වූ සේවකයන් පමණක් වැඩෙහි යෙදවීම කොන්ත්‍රාත් ගිවසුමේ කොන්දේසියක් වන අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයගේ සම්මුතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්ෂවරයා විසින් අවසර දෙනු ලබන විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසිය නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළ සේ සලකනු ලැබීමට ද කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමට ද යටත් වේ. එවැනි අනුමතියක් හෝ අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩ කෙරෙන ප්‍රදේශයෙහි නොවූ සේවකයන් වැඩෙහි යෙදීම තහනම්ය.

ජී. එච්. බී. ඒකනායක.
ම. ප. අධ්‍යාපන නිලධාරි තැන.

අධ්‍යාපන කාර්යාලය,
මහනුවර, 1959 මාර්තු 23 වෙනි දින.

**නියෝජ්‍ය ආහාර පාලක තැනගේ සැපයීමේ ස්ථානවල සිට ප්‍රදේශයේ පාසැල්වලට බනිස් සපයන බේකරිකරුවන් වෙත "ඇදිහැස" පිටි (රු. 50 මිටි වලින්) ගෙනයාම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගැනීම**

මහනුවර අධ්‍යාපන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ඉහත සඳහන් සේවය සඳහා සීල් තබනලද පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර 1959 අප්‍රේල් මස 20 වෙනි දින පෙරවරු 9.30 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් කරුවන් මේ සේවය සඳහා ටෙන්ඩර් පිළියෙල කිරීමේ දී, රු. 50 පිටි මිටියක් සැතැප්මක් දුර ගෙනයාමට අයකරනු ලබන ගාස්තුව මුල්කොට ගතයුතුයි. ටෙන්ඩර් කරුවන් විසින් කළයුතුව ඇත්තේ පහත දක්වා ඇති නියෝජ්‍ය ආහාර පාලක තැනගේ සැපයීමේ ස්ථානවල සිට මහනුවර, නුවරඑළිය හා මාතලේ දිස්ත්‍රික්ක තුළ නිවැසි පාසැල්වලට බනිස් සපයන්නන් වෙත "ඇදිහැස" පාන් පිටි ගෙනයාමයි. යටත් පිරිසෙයින් මාස එක හමාරකට වරක් බැගින් බනිස් සපයන්නන් වෙත පිටි ගෙනගොස් භාරදිය යුතුයි. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් මහනුවර අධ්‍යාපන නිලධාරිතුමා විසින් නියෝග කරන පරිදි නිකුත් කිරීමේ බලපත්‍ර ලැබී දින තුනක් ඇතුළත දී බලපත්‍ර ලත් බනිස් සපයන්නන් වෙත පිටි ගෙනගොස් බාරදිය යුතුයි.

3. තෝරාගනු ලැබූ ටෙන්ඩර් කරු විසින් මුදලින් රු. 500ක් ඇප තැබිය යුතුයි.

4. ටෙන්ඩර් පත්‍ර අවසාන වශයෙන් භාරගන්නා ලද දින සිට තෙමසක් යනතුරු ටෙන්ඩර් වලංගුව තැබිය යුතුයි.

5. භාරගන්නා ලද ටෙන්ඩර් පත්‍ර 1959 අප්‍රේල් මස 20 වෙනි දින පෙරවරු 10ට අධ්‍යාපන නිලධාරිතුමාගේ කාර්‍යාලයේදී විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ටද එහි පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

6. මේ පිළිබඳව ඇති තවත් කොන්දේසි ආදියෙහි සම්පූර්ණ විස්තර මධ්‍යම පළාතේ අධ්‍යාපන කාර්‍යාලයේදී, මෙම පළාතේ කච්චේරි හෝ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරිතුමන්ගේ කාර්‍යාල වලදී බලාගත හැක.

**ඉහත සඳහන් නියෝජ්‍ය ආහාර පාලක තැනගේ සැපයීමේ ස්ථානවල ලැයිස්තුව**

| මහනුවර දිස්ත්‍රික්කය | මාතලේ දිස්ත්‍රික්කය | නුවරඑළිය දිස්ත්‍රික්කය |
|---|---|---|
| මහනුවර | මාතලේ | නුවර එළිය |
| පේරාදෙනිය | | හැටන් |
| ගම්පොල | | තලවාකැලේ |
| කඩුගන්නාව | | රාගල |
| නාවලපිටිය | | |
| කටුගස්තොට | | |
| වත්තේගම | | |

ජී. එච්. බී. ඒකනායක,
මධ්‍යම පලාතේ අධ්‍යාපන නිලධාරි තුමා.

1959 මාර්තු මස 23 වෙනි දින,
මහනුවර අධ්‍යාපන කාර්‍යාලයේ දී ය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් බෝඩ් සභාපති තැන විසින් 1959 අප්‍රේල් 24 දින පස්වරු 2.30 දක්වා පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| පාසැලේ නම | වැඩ විස්තර |
|---|---|
| (1) බිටී/කුරුඳුවින්න මිශ්‍ර පාඨශාලාව | පාසැල් ගොඩනැගිල්ල, ගුරු නිවාස, ළිඳ සහ වැසිකිළි තැනීම |
| (2) බදි/මහියංගන මිශ්‍ර පාඨශාලාව | රසායනාගාරය |
| (3) බදි/දැලිව මිශ්‍ර පාඨශාලාව ... | පාසැල් ගොඩනැගිල්ල, ගුරු නිවාසය සහ වැසිකිළි |

සංලක්ෂ්‍යය : බිටී=මඩකලපු දිස්ත්‍රික්කය
බදි=බදුලු දිස්ත්‍රික්කය

2. අංක 1 සහ 2 සඳහා රුපියල් 25,000 ඉහල, අංක 3 සඳහා රුපියල් 20,000 ඉහල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ අංක 1 සහ 2 සඳහා රුපියල් 50,000 ඉහල, අංක 3 සඳහා රුපියල් 40,000 ඉහල ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී සිටින අයට කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂක තුමාගේ කාර්යාලයේ ඒ. සී. ශාඛාවෙන් හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක එක් එක් වැඩය සඳහා රුපියල් 100ක් තැන්පත් කළ කුවිතාන්සියක් බන්ඩාරවෙල අධ්‍යාපන නිලධාරි තැනට ඉදිරිපත් කිරීමෙන් 23.4.59 පස්වරු 3.30 දක්වා ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. චැක්පත්, මනි ඕඩර්, පෝස්ටල් ඕඩර් භාරගනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර සඳහා මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය මුදල් ගෙවීමේ කුවිතාන්සි, කොළඹ, අධ්‍යාපන අධ්‍යක්ෂක තුමාගේ කාර්යාල යේ ගොඩනැගිලි ශාඛාවෙන් හෝ ඌව පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැක. මුදල් ගෙවීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ දෙවන ඡේදයේ සඳහන් පරිදි ලියාපදිංචි වී සිටින බව ඔප්පු කළ හැකි අයට පමණී.

4. ඉහත සඳහන් පරිදි පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍රිකා ඌව පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබා ගත හැක. මේ සම්බන්ධ සැලැස්මවල් හා සියලුම වැඩි විස්තර බන්ඩාරවෙල අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබා ගත හැක. කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් බෝඩ් සභාපති තැනට ටෙන්ඩර් පත්‍රිකා ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුයි. දේශීය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍රිකා ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමට අකමැති නම් ඔවුන් හෝ ඔවුන්ගේ ඒජන්ත වරුන් සීල් තබන ලද ටෙන්ඩර් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාර තැනට භාර දී, එසේ භාරගත් බවට ඒ විගසම ලියවිල්ලක් ලබා ගත යුතුයි. මුද්‍රාව තබන ලද ටෙන්ඩර් පත්‍රිකා ඇතුළත් කවරය මත ටෙන්ඩර් කරුවාගේ නම සහ ලිපිනයත් වැඩයෙහි විස්තරත් සඳහන් කළ යුතුයි.

5. කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී 24.4.59 දින පස්වරු 2.30ට ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන්ගේ ගණන් පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ට කියවනු ලැබේ.

6. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ඉල්ලීම් ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති හයක කාලයක් තුළ විවෘතව තැබිය යුතුයි.

7. ටෙන්ඩර් කරුවන් විසින් සේවය සඳහා බඳවා ගත හැක්කේ එම වැඩ කරන ප්‍රදේශයේ පදිංචි පුහුණු හෝ නුපුහුණු ලාංකික කම්කරුවන් පමණී. මෙය කොන්ත්‍රාත්තුවේ කොන්දේසියක් වශයෙන් සලකන බවත් එසේ කිරීමට අසමත් වන කොන්ත්‍රාත් කරුවන් කොන්දේසි කඩකළවුන් හැටියට සලකනු ලබන බවත් සැලකිය යුතුයි. විශේෂ හේතුන් උඩ අධ්‍යාපන අධ්‍යක්ෂක තැන අධ්‍යාපන අමාත්‍යාංශයේ සථිර ලේකම් තුමා සමග සාකච්ඡාකොට, ලාංකික නොවන කම්කරුවන් හෝ වෙන ප්‍රදේශවල පදිංචි කම්කරුවන් යෙදවීමට අවසරයක් දුන්නොත් හැර එසේ අවසරයක් නොමැතිව එවැනි කම්කරුවන් සේවයේ යෙදවීම කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට හේතු වන බව සැලකිය යුතුයි. අනුමැතියක් හෝ සම්මතියක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් හෝ වෙන ප්‍රදේශවල පදිංචි කම්කරුවන් හෝ යෙදවීම තහනම්ය.

ඊ. නාගොඩවිතාන,
ඌව පළාතේ අධ්‍යාපන නිලධාරි තැන.

අධ්‍යාපන කාර්‍යාලය,
බන්ඩාරවෙල, 28. 3. 59.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

**අංගොඩ දෙඩන්ගහහේන, 1 ඩබ්ලිව් වර්ගයේ ගෙවල් 25ක් සහ ළිං 1ක් තැනීම**

අංගොඩ, දෙඩන්ගහහේන නමැති ඉඩමෙහි 1 ඩබ්ලිව් වර්ගයේ ගෙවල් 25ක් සහ ළිං 1ක් තැනීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1959 අප්‍රේල් මස 24 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මාතෘ ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා රුපියල් 100,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත්කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියාපදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 100ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1959 අප්‍රේල් මස 22 වෙනි බදාදා දවල් 12 වනතුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

රෙ. ලෝ. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 1.
30. 3. 1959.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 59.3.31.

---

කොළඹ රිජ්න්ට් වීදියේ අළුතෙන් ගොඩනගා ඇති ඇස් ස්පිරිතාලේ වාට්ටුවලට වැසිකිළි කාණ්ඩයක් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති තැන විසින් වර්ෂ 1959යේ අප්‍රියෙල් මස 29 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්ම වල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ අප්‍රියෙල් මස 17වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 17,500ට, නොඅඩු ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවටය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59.3.31

---

අංගොඩ උමතු රෝහලේ අළුත් වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ අප්‍රියෙල් මස 29 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ, ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ කොළඹ නැගෙනහිර කොටස භාර ගොඩනැගිලි පිළිබඳ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ අප්‍රියෙල් මස 17 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 5,000ට, නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 59.3.31.

---

පේරාදෙණියේ විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු අංශයේ කායභීල ගොඩනැගිල්ල සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හී පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959 අප්‍රියෙල් මස 29 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. පේරාදෙණියේ විශ්ව විද්‍යාල ගොඩනැගිලි භාර ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959 යේ අප්‍රියෙල් මස 17 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ "ඒ", "බී" සහ "සී" යන කොටස් යටතේ ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවටය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59.3.31

---

නුවර ආරෝග්‍ය ශාලාවේ අතිරේක වැඩ සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ අප්‍රියෙල් මස 29 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මහනුවර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිට පතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ අප්‍රියෙල් මස 17 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 8000ට, නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 59.3.31.

---

නුවර අස්ගිරියේ සුනඛයින්ගේ වාස භූමිය අළුත් වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ අප්‍රියෙල් මස 29 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මහනුවර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිට පතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 59.3.31.

---

ඇල්ල නානායමේ මූළුතැන්ගෙය අළුත් වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ අප්‍රියෙල් මස 29 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. බදුල්ලේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිට පතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ අප්‍රියෙල් මස 17 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 10,000ට, නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 59.3.31.

---

# බඩු බාහිරාදිය විකිණීම්

## පාවිච්චි කරන ලද බඩු වෙන්දේසියක්

1959 යේ අප්‍රේල් මස 15වෙනි බදාදා පස්වරු 2.30ට පාවිච්චි කරන ලද පහත සඳහන් බඩු වැවසියර් භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසි කරනු ලබන බඩු පරීක්ෂා කර බැලීම සඳහා වෙන්දේසිය පටන් ගැනීමට සවල්ප වේලාවකට කලින් වෙන්දේසි පොලේ තබනු ලැබේ.

වෙන්දේසියේ ගනු ලබන බඩුවල මුදල් වෙන්දේසි පොලේදීම ගෙවිය යුතුයි. මෝටර් රථවල බැටරි, ටයර, ට්‍යුබ්, අල්මාරි, බූරු ඇඳන්, ජී. ඕ. එච්. පුටු, අත් පුටු, අයිස් පෙට්ටි, විදුලි පංකා, (මේස උඩ තබන), ලොකර්ස් ආදී භාණ්ඩ බොහොමයක් ඇතුළත් වේ.

ආර්. වේලුපිල්ලෙයි,
කොළඹ මණ්ඩලිය ආරෝග්‍යශාලා අධිකාරි තැන.
වෙනුවට.

මහාරෝග්‍ය ශාලාව, කොළඹ.
1959.3.21,

---

# විශෙෂ නිවේදනයයි

1959 අප්‍රේල් 10 වැනි සිකුරාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1959 අප්‍රේල් මාසයේ දෙවැනි සුමානයේ ගැසට් පත්‍රය, 1959 අප්‍රේල් 9 වැනි බ්‍රහස්පතින්ද නිකුත් කරන බැවින්, එහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1959 අප්‍රේල් 6 වැනි සඳුද පස්වරු 4ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1959 මාර්තු 23 වැනි දින,
කොළඹ, ආණ්ඩුවේ මුද්‍රණාලයේ දීය.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

# විශෙෂ නිවේදනයයි

1959 අප්‍රේල් 14 වැනි අඟහරුවාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1959 අප්‍රේල් 17 වැනි දින නිකුත්කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1959 අප්‍රේල් 13 වැනි සඳුදා පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1959 මාර්තු 26 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරණු ලබන සංශොධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**(සෑම සිකුරාද දිනයන්හි පළ කරණු ලැබේ)**

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ **ප්‍රසිඩ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාද දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30 ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනිම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ, නමක් වෙනස් කිරිම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරණු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඩ කරණු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අය කරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට.... ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුවම අය කරණු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරණු ලැබේ.** ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින තුනකට ප්‍රථම **පස්වරු 4ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාද පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| **වාර්ෂික දායක මුදල** ... ... ... | **එක් කාණ්ඩයක් සඳහා** | **15** | **0** |
| | **I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ...** | **7** | **0** |
| **සෑම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට...** ... | ... ... | **0** | **25** |
| | **තැපැල් ගාස්තුවත් සමග** | **0** | **31** |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... ... | ... ... | 0 | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 14 |

15. **පරණ ගැසට් කොපි තිබේනම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.**

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.